

# නිකාය සංග්‍රහය

# හෙවත්

# ශාසනාවතාරය.

# NIKAYA-SANGRAHA;

OR,

# SÁSANÁWATARAYA:

## A HISTORY OF BUDDHISM IN INDIA AND CEYLON.

BY

DÉWARAKSHITA - DHARMAKÍRTTI SANGHARÁJA.

---

# නිකාය සඞ්ග්‍රහය

හෙවත්

# ශාසනාවතාරය.

දෙවරක්ෂිතාභිධාන ද්විතීය ධර්මකීර්ති සඞ්ඝරාජයන්
විසින් විරචිතයි.

COLOMBO:
H. R. COTTLE, GOVERNMENT PRINTER, CEYLON.

1922.

## PREFACE.—සංඥාපනය.

---

**නිකායසංග්‍රහය** නම්වූ මේ ප්‍රකරණය රාජරාජමහාමාත්‍යාදීන් නිසා මේ ලංකාද්වීපයෙහි බුද්ධශාසනය පවත්නා බව හඟවනු පිණිස ශාසනාවතාර චරිතයක් වශයෙන් බුද්ධ වර්ෂ 1934 වන්නෙහි ලංකා රාජ්‍යශ්‍රීයට පැමිණි **වීරබාහු** මහරජාණන් දවස දේව රක්ෂිත යන පූර්වනාමයක් ඇති **ජයබාහු** මහා ස්ථවිරයන් විසින් කරනලද්දකි. මූන්වහන්සේ ස්වකීයාචාර්ය්‍ය සංඝරාජයාණන්ගේ ඇවෑමෙන් ඒ නමින්ම ධර්මකීර්ත්ති සංඝරාජයයි ප්‍රසිද්ධව විසූබැව් ග්‍රන්ථාවසානයෙහි පෙනේ.

ලංකා ඉතිහාසය සම්බන්ධ බොහෝ වැදගත් කරුණු මේ ග්‍රන්ථයෙහි නිර්මලලෙස ප්‍රකාශිත බැවින් මෙය සාමාන්‍ය ලෝකයාට ඉතා ප්‍රයෝජනවත් වේමය. ක්‍රිස්තු වර්ෂ 1890දී මේ පොත ආණ්ඩුවේ මුද්‍රායන්ත්‍රාලයෙහි පළමුවෙනි වරට දොන් මර්තීනු ද සිල්වා වික්‍රමසිංහ මහත්මයාගේ ශුද්ධියෙන් යුක්තව අච්චුගස්වන ලදී. මේ ග්‍රන්ථය ආණ්ඩුවේ නියමයපිට අප විසින් වැඩිදුරටත් ශුද්ධකොට දැනට තෘතීය වාරයට සංස්කරණයකරනලදී.

SIMON DE SILVA.
A. MENDIS GUNASEKARA.
W. F. GUNAWARDHANA.

වර්ෂ 1922ක්වූ මාර්තු මස
16වෙනි දින කොළඹදීය.

# NIKAYA-SANGRAHA

OR

# SÁSANÁVATÁRA.

# නිකාය සඞ්ග්‍රහය

හෙවත්

**ශාසනාවතාරය.**

---

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

---

ස්වස්ති ප්‍රශස්ත ශ්‍රීඝන සකලශාසනශ්‍රීභාරධාරී ශ්‍රීලඞ්කාධිප ප්‍රදීපායමාන ලෝකශාසනානුරක්ෂණයෙහි දක්ෂ ගුණනීතිමාර්ගානුවර්තක මධ්‍යස්ථාභිජාත කීර්තිප්‍රබන්ධ ශුද්ධ බෞද්ධ ශ්‍රද්ධාවත් රාජ රාජ මහාමාත්‍යාදීන්ට ආයුරාරෝග්‍යාදිවූ සකලාභිවෘද්ධිවර්ධනය පිණිස සාදරාර්ජිත පුණ්‍යසම්භාරප්‍රදාන පූර්වඞ්ගමව අනුනයප්‍රතිඝ පරිත්‍යක්ත මහාස්ථවිරවරයන්ගේ පූර්වලිඛිතය හා ඇසූදුටු ප්‍රත්‍යක්ෂ කාර්‍ය්‍යමාර්ගය ආශ්‍රය කොටගෙන ජිනවරපරිනිර්වාණයෙහි පටන් පස්වෙනි **භුවනෙකබාහු** පසලොස්වනු මෙවක් පෙරවැ පැවති ශාසනප්‍රවෘත්තිය සැකෙවින් හඟවනු පිණිස **දෙවරක්ෂිත ස්ථවිරාභිධාන** පූර්වනාම ප්‍රකාශිත **ජයබාහු මහා ස්ථවිරපාදයෝ** “**නිකාය සඞ්ග්‍රහ**” නම්වූ ශාසනාවතාර චරිතයක් ගෙනහැර දක්වත්. එද වනාහි ධර්මානුගත කථාප්‍රබන්ධයෙක්මය. එසේ හෙයින් ආදර සහිතව සිත්හිලා ඇසියයුතු.

අප මහාගෞතම බුදුරජාණන්වහන්සේ පෙර කරුණාපුරස්සර ප්‍රඥාගති ඇති **සුමේධ** නම් මහතවූසක්ව **දිවකුරුබුදුන්** හමුව හස්තගතවූ නිවන්සම්පත් හැර මුළු තුන්ලොවට හිතපිණිස බුදු බැව් පතා ලබනලද විවරණ ඇතිව බුද්ධකාරකධර්මයන් පූරන අභිප්‍රායෙන් සසරවැද මෑතභාගයෙහිදු උපනුපන් බුදුන් නොවර දවා දැක විවරණශ්‍රී ලදින් සාරාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් මුළුල්ලෙහි නිරතුරුව වඩනාලද එකාකාර වීර්‍ය්‍ය ඇතිව දශප්‍රකාර පාරමීධර්ම

යත් මුහුකුරුවා තුසීපුර පැමිණ දශසහස්‍රිලෝකධාතුවැ දෙවි බඹුන්ගේ අයජමෙන් පස්මහබැලුම් බලා ප්‍රථම කල්පෝද්භූත **මහා සම්මත රජහු** පටන් අසම්භින්නව පැවති එකවංශප්‍රසූත සත්ලක්‍ෂ සත්දහස් සත්සිය සතානූවක් පමණ රජුන් අතුරෙන් අභිෂේක ප්‍රාප්ත තුන්ලක්‍ෂ සූතිස්දහස් පන්සිය එකානූවක් පමණ හිරුගොත් රජුන් කෙරෙහි අන්තගීතව එකල කපිලවස්තුපුරයෙහි රජ පැමිණි උභයකුල පරිශුද්ධ **ශුද්ධොදන නරපතිහු** නිසා **මහාමායා දේවීන්** කුස පිළිසිඳ දශමාසාවසානයෙහි වෙසඟ පුණුපොහෝ ලද අඟහරුවා දින පසළොස්පැ පිරුණු සඳ විසානැකතින් ලුම්බිනී නම් මඟුලුයන්හි මවුකුසින් බිහිව අනුක්‍රමයෙන් වැඩී යෞවනප්‍රාප්තව **යශෝධරාදේවී** ප්‍රමුඛ සතලිස් දහසක් පමණ පුරාඞ්ගනාවන් පිරිවරා රම්මය, සුරම්මය, සුභය යන තුන්පායෙහි වෙසෙමින් ශක්‍රදෙවෙන්ද්‍ර ලීලාවෙන් රාජ්‍යශ්‍රී විඳ සතර පූර්වනිමිත්ත දැක **කන්ථක** නම් අශ්වරාජයා පිටට පැනනැඟී මහභිනික්මන් නික්ම එකුන්තිස් අවුරුද්දෙහි මහණව සාවුරුද්දක් මහාවීර්‍ය්‍ය කොට ඉක්බිති **සුජාතා** නම් සිටුදුව දුන් මිහිරි කිරිබත වළඳා සල් වෙනෙහි දිවාවිහාරකොට සවස්වේලෙහි **සොත්ථිය** නම් බමුණකු විසින් එළවනලද කුසතණ අටමිටක් ගෙන බෝමැඩකරා එළඹ ඇසතු බෝමුල්හි කුසතණ සලා වගුරුවා තුදුස්රියන් විදුරසුන් නැඟී බෝකඳට පිටලා චතුරඞ්ගවීර්‍ය්‍යාධිෂ්ඨානයෙන් පලක් බැඳ වැඩහිඳ සපිරිවාර මාර පරාජයකොට මගධෙශ්වරවූ **බිම්සරරජ** හට සොළොස්වැන්නෙහි වෙසඟපුණුපොහෝලද විසානැකතින් පන්තිස්වන වයසැ සර්වඥපදප්‍රාප්තව සත්සති ගෙවා බ්‍රහ්මාරාධනා පිළිගෙන ඉසිපතන උයන්හි දම්සක් පවත්වා පන්සාලිස් අවුරුද් දක් මුළුල්ලෙහි ලෝවැඩ වඩා වැඩසිට මගධාධිපතිවූ **අජාසත් රජ** හට අටවැන්නෙහි වෙසඟ පුණු පොහෝලද අඟහරුවාදින විසානැකතින් කුසිනාරානුවර මල්ලරජුන්ගේ "**උපවත්තන**" නම් සාලවනොද්‍යානයෙහි යුගමසාලාභ්‍යන්තරයෙහි පනවනලද යහන්හි වැඩහෙව අලුයම් රාත්‍රියෙහි නිරුපධිශෙෂනිර්වාණධාතු වෙන් නිවන්පුර පරායණවූ සත්වන දවස් එපවත් අසා ශෝක යෙන් වහස්නා * අධුනක් මහණ ගණයා දැක මහලුකල මහණවූ "**සුභද්‍ර**" නම් අභද්‍ර මහණෙක් මහත්වූ සන්තොෂයට පැමිණ කියනුයේ "ඇවැත්නි ශොක නොකරව, නොහඬව, යහපත නපුර කියා අපට වෙහෙස දෙන මහමහණහු මළ පසු මෙවිට අප කැමැත්

* සුභද්‍රා පෘථජ්ජන—ඇතම.

තක්මය, එසේ හෙයින් සොම්නස් වූවමනාතන්හි කුමක් පිණිස දෞම්නස්ව හඬව්ද, මෙතැන්පටන් අප කැමැත්තක් කරම්හ, නොකැමැත්තක් නොකරම්හ ” යි කීය.

එකල බුදුන්ගේ තෘතීය මහාශ්‍රාවකව සිටි මහසුප් මහතෙරුන්වහන්සේ එතෙපුල් අසා මතු එබඳු පාපි මහණුන්ට අවසර නොවනසේ ධර්මසඞ්ගායනාකරනු කැමැතිව පන්සියයක් පමණ මහාක්ෂීණාශ්‍රවයන්වහන්සේ පිරිවරා **රජගහානුවරට** වැඩ අජාසත් රජහට එපවත් **ද**න්වායවූහ.

එකල **අජාසත්මහරජාණෝ** රජගහානුවර **වෙභාරපර්වත** ප්‍රාන්තයෙහි **සප්තපර්ණී** නම්වූ ගල්ගුහාද්වාරයෙහි අනෙක ප්‍රකාර විචිත්‍ර චිත්‍රකර්මාන්ත විශෙෂයෙන් යුක්ත දිව්‍යසභාවක් හා සාදෘශ්‍යවූ මණ්ඩපයක් කරවා නානාවිධ පුෂ්පොපහාර සමලඞ්කෘත භූමිභාග ඇති කනක රජත මණිතාරකාදීන් විචිත්‍ර ශ්වෙතවිතාන බඳවා ඒ මණ්ඩප මධ්‍යයෙහි විසිතුරුකොට සරහා පනවනලද ධවලාතපත්‍රයෙන් විරාජමානවූ ධර්මාසනය පිරිවරා හාත්පස්හි පන්සියයක් ආසන පනවා එකල සත්ලක්ෂයක් පමණ ගණප්‍රධාන මහාක්ෂීණාශ්‍රවයන්වහන්සේට නායකවසිටි එම **මහසුප් මහතෙරුන්වහන්සේ** ඇතුළුවූ ත්‍රිපිටක පර්‍යාප්ති ප්‍රභෙදධර ත්‍රිවිද්‍යා අෂ්ටවිද්‍යායෙහි කෙළ පැමිණි සිව්පිළිසිඹියාපත් පන්සියයක් රහතුන්වහන්සේ එහි වඩා හිඳුවා හස්ත්‍යශ්වරථපත්තිසඞ්ඛ්‍යාත චතුරඞ්ගිනී සෙනාව මෙහි අතුරු නොහැර සිසාරා රැකවල් ලවා ඉක්බිති බුදුන් ජීවමාන කාලයෙහිම ඒ ඒ ව්‍යතික්‍රමවස්තූත්පත්ති නිමිත්තකොට ගෙන ශාසනස්ථිතිය සඳහා පනවනලද පන්සිය පස්විස්සක් පමණ ශික්ෂාපදයෙන් ප්‍රතිමණ්ඩිතවූ **පරිජි පචිති** දෙපොත හා—**මහවග්ගය, සුළුවග්ගය, පරිවාරය, ධම්සඞ්ගණිය, විභඞ්ගප්‍රකරණය, කථාවත්ථුය, පුද්ගලප්‍රඥප්තිය, ධාතුකථාය, ඉන්ද්‍රියයමකය, මූලයමකය, ඒකපට්ඨානය, තිකපට්ඨානය, ඒකතික පට්ඨානය, දීඝ නිකාය, මධ්‍යම නිකාය සංයුත් නිකාය, අඞ්ගුත්තර නිකාය, ඛුද්දක නිකායෙහි* ඛුද්දකපාඨය, ධම්මපදය, උදානය, ඉතිවුත්තකය, සූත්‍රනිපාතය, විමානවත්ථුය, ප්‍රෙතවත්ථුය ථෙරගාථාය, ථෙරීගාථාය, ජාතකය, නිද්දෙශය, ප්‍රතිසම්භිදාය, අපදානය, බුද්ධවංශය, චරියාපිටකය,** යනාදිවූ ප්‍රකරණ විභාගයන් හා දෙලක්ෂ පන්සැත්තෑ

---

* ඛුද්දකනිකායෙහි—සූත්‍රනිපාතය, ධම්මපදය, උදානය, ඉතිවුත්තකය යනාදි විශෙෂ පොත්.

දහස් දෙසියපනස් ග්‍රන්ථසඞ්ඛ්‍යාවක් ඇතුළුවූ සුවාසූදහසක් ධර්‍මස්කන්ධයෙන් යුක්තවූ පාලිධර්‍මය විනයාභිධර්‍මසූත්‍රසඞ්ඛ්‍යාත පිටකත්‍රයෙහි සඞ්ග්‍රහකරවීමෙන් දිව සුවඳවර්ෂා වස්වමින් මහපොළොව ගුගුරුවමින් සත්කුලපව් බමවමින් නොයෙක් ලොකොත්සව පවත්වමින් සත්මසකින් ධර්‍මසඞ්ගායනාවසානයකරවා **ශාරිපුත්‍ර මෞද්ගල්‍යායන මහාකාශ්‍යපාදී** මහාස්ථවිර පරම්පරාවෙන් අසම්භින්නව පැවත එන **ස්ථවිරනිකාය** නම් ලද මේ මහාභික්ෂු සන්තතිය පස්වා දහසක් නොපිරිහී පවත්නා පරිද්දෙන් බුද්ධශාසනය තන්පත් කරවූහ. එසේ හෙයින් කියනලදී :—

"සාධුකාරං දදන්තීව සාසනට්ඨිති **කාරණා**,
සඞ්ගීතිපරියොසානෙ අකම්පිත්ථ මහාමහී"—

ඉක්බිති **ඒ** අජාසත්රජහු පටන් **උදයභද්‍රය, අනුරුද්ධය, මුණ්ඩය, නාගදාසකය, සුසුනාගය,** යන මේ මගධරජුන් සදෙනා ඇවෑමෙහි සත්වැනිව **පැළලුප්නුවර** රජ පැමිණි **කාලාශෝක රජහු** දසවැන්නට අප බුදුන් පිරිනිවි සියක් අවුරුදු සම්පූර්ණ විය. එකල **විශාලානුවර** මහාවනවිහාරයෙහි වසන වජ්ජිභික්ෂුහු "කප්පති සිඞ්ගිලොණකප්පො, කප්පති ද්වඞ්ගුල කප්පො, කප්පති ආවිණ්ණකප්පො, කප්පති ජාතරූපරජතං,"* යනාදීන් අභූතපූර්‍වවූ අභිප්‍රායානුකූලවූ දශ වස්තුවක් උපදවා **විනය** ප්‍රඥප්ති පෙරළාගෙන රන්රිදී ආදිය පිළිගනිමින් ශාසනය භෙද කළහ.

එකල්හි **යශ** නම් මහතෙර කෙනකුන්වහන්සේ එපවත් අසා විමසා ගොස් දොළොස්ලක්ෂයක් පමණ මහරහතන් රැස්කරවා ආර්‍ය්‍යගණමධ්‍යයෙහි **රෙවත** නම් මහතෙරකෙනකුන්වහන්සේ ලවා ඒ දශවස්තුව පිළිවිස්වා **සබ්බකාමී** නම් මහතෙරකෙනකුන්වහන්සේ ලවා ඒ දශවස්තුව විසර්ජ්ජනය කරවා විනයාන්විත නොවන්බව ප්‍රකාශකොට ඉක්බිති "අධර්‍මවාදීන් මර්‍දනය කරවා ධර්‍මය බබුළුවමි" යි මහසඟපිරිවරින් විශාලාමහනුවර මහාවන විහාරය බලා නික්මුණුසේක.

එකල ඒ අලජ්ජිවූ වජ්ජිභික්ෂුහු කාලාශෝකරජු කරා ගොස් නොයෙක් ලෙස කාරණ කියා "මහරජ අප වසන මහාවන විහාරය නියා **යශ** නම් මහතෙරකෙනෙක් බොහෝ සඟපිරිස් හැර ගෙන එමින් සිටියහ, ඔවුන් ඇම නවත්වාපියව" යි කීහ. ඒ

---

* මේ සතර අතතරභතරයෙන්.

තෙපුල් අසා රජ තමා සුසීල දුස්සීලයන්ගේ සමාචාරවිභාග නො දන්නා හෙයින් ඔවුන්ගේ මැසිවිලි මුසු අද්‍යොනා බස් ගිවිස “ යස මහාස්ථවිරාදිවූ ඒ මහණගණයා මාගේ විජිතයට බට නොදෙව ” යි විධානකොට පිරිස් යවූහ. පිරිස් මංවැරද දෙවතානුභාවයෙන් අන් දිසාවෙක ගියහ. එම දවස් රාත්‍රිභාගයෙහි යහන් මස්තකයෙහි නිදනුයේ තමා එම මනුෂ්‍යශරීරයෙන් ගොස් ලෝකුඹුනරකයෙහි පැසෙනසේ සිහිනෙන් දැක පිබිද නොනිදම හිඳ පහන්කොට දෙවනදවස් තමාගේ සහෝදර ජ්‍යෙෂ්ඨභගිනිවූ රහත් මෙහෙණින්නන්දැක එපවත් කීහ. ඉක්බිති ඒ මෙහෙණින්න විසින්:—

“ අලජ්ජීනං බලං දත්වා හාපෙති විනයං මම,
ජීවනෙතායෙව ජාතොසි ගම්භීරා ලොහකුම්භියා ”—යි.

යනාදීන් “ මේ ලොකයෙහි ගෘහස්ථ ප්‍රව්‍රජිතාදිවූ යම් කිසිවෙක් අලජ්ජිවූ පාපි මහණුන්ට බලය දී මා විසින් පනවනලද විනය ප්‍රඥප්ති පිරිහෙළා කෙළසුවහසක් සක්වළ පැතිර පවත්නාවූ මාගේ ආඥාව මර්දනය කෙළේ වීනම් එතෙම ඒකාන්තයෙන් අපායෙහිම උපදනේය. ජීවත්වේ නමුදු නොමියනතුරු ඒ මනුෂ්‍ය ශරීරයෙන්ම ගොස් ගිනිගෙන දිලිසෙන ලොහොදියෙන් පිරී තිබෙන අතිගම්භීරවූ ලොහොකුඹුනරකයෙහි උපන්නක්හු වැනි වෙයි ” යනු බුදුන් විසින් වදාරනලදී. එසේහෙයින් මහරජ ඒ අලජ්ජි වජ්ජීන් හැර ලජ්ජීන්වහන්සේට බලයදී පස්වාදහසක් පවත්නා බුද්ධශාසනයට පිටිවහල්ව කල්පයක් දවස් දිව්‍යමනුෂ්‍ය සම්පත් විඳිනාසේ කුශලරාශි වර්ධනයකරව ” යි අවවාදකොට ගියකල්හි එදිනම විශාලාමහනුවරට ගොස් ඒ දශවස්තුව ඉපදවූ දසදහසක් පමණ පාපි මහණුන් සස්නෙන් පිටත්කරවා එතැන්හි රැස්වූ දෙලොස් ලක්ෂයක් පමණ රහතන්වහන්සේ අතුරෙන් **සබ්බකාමි** ස්ථවිරයන්වහන්සේ හා **යස** නම් මහතෙරුන්වහන්සේ ඇතුළුවූ සත්සියයක් පමණ රහතන්වහන්සේ විශාලාමහනුවර වාලුකාරාම නම් විහාරයෙහි රැස්කරවා ඒ කාලාශොක මහරජාණෝ **ස්ථවිරවාද** නම් ලද සියලු ධර්ම විනය දෙක නැවත පිටක නිකායාදි වශයෙන් විභාගකරවමින් අටමසකින් ධර්මසඞ්ගායනාවසානය කරවා බුදුසසුන් පැවැත්වූහ. එසේහෙයින් කියනලදී:—

“ එත්තාවතා දසසහස්ස සුපාපභික්ඛූ
නිද්ධුය ධූතදසවත්ථුමලං අකංසු,
යෙනෙත සුනිම්මල යසෙන යසෙන සඞ්ඝං
සඞ්ගීතිමුජ්ඣිතමලා අපි දස්සිතා සා ”—යි.

එකල ඒ විතිය සඞ්ගීතිකාරක මහාස්ථවිරවරයන් විසින් තෝරා හරනලද දසදහසක් පමණ පාපි භික්ෂූහු ශාසනප්‍රතිෂ්ඨා නොලදින් පක්ෂබල සොයා ප්‍රත්‍යන්ත දෙශයකට ගොස් ධර්මාධර්ම විචාරයට අසමර්ථවූ මණ්ඩලිකරජක්හු ලදින් ස්ථවිරවාද බිඳ "අපිද මෙවිට ධර්ම සඞ්ගායනාවක් කරම්හ" යි ඔවුනොවුන් හා මන්ත්‍රණය කොට අභූතපූර්වවූ අපූර්වපාඨ බහා පූර්වාපරවිරොධ නොබලා අභිප්‍රායානුකූලවූ අර්ථකථා උපදවා ධර්මය පෙරළා ගෙන **මහාසංඝික** නම් ආචාර්යනිකායක්ව ජයමහාබොධියෙන් බට ලහටු කැටියක් සේ එතැන් පටන් ක්‍රමයෙන් අවුරුදු සියයක් ඇතුළත **මහාසාඞ්ඝිකය, ගොකුලිකය, එකබ්බොහාරිකය, ප්‍රඥප්තිවාදිය, බාහුලිකය, චෛත්‍යවාදිය, මහිංසාසකය, වජ්ජිපුත්‍රකය, ධර්මොත්තරිකය, භද්‍රයානිකය, ඡන්නාගාරිකය, සම්මිතිකය, සර්වාස්තිවාදය, ධර්මගුප්තිකය, කාශ්‍යපිය, සඞ්ක්‍රාන්තිකය, සූත්‍රවාදිය** යි කියා සතළොස් නිකායෙක් වූහ. එතකුදුවූවත් දෙවෙනි ධර්ම සඞ්ගායනාවෙහි පටන් ත්‍රිපිටකධර්මය එක්සිය අටළොස් අවුරුද්දක් නිර්මලව පැවැත්තේමය. ඉක්බිති ඒ කාලාශොක රජු කෙරෙහි පටන් **භද්‍රසෙනය, කොරණ්ඩය, මඞ්ගුරය, සර්වඤ්ජහය, ජාලිකය, උභකය, සඤ්ජයය, කොරව්‍යය, නන්දිවර්ධනය, පඤ්චමකය,** යන දසබෑරජුන් හා **උග්ගසෙනනන්දය, පණ්ඩුකනන්දය, පණ්ඩුගතිනන්දය, භූතපාලනන්දය, රට්ඨපාලනන්දය, ගොවිසාණනන්දය, දසසිද්ධකනන්දය, කෛවර්තනන්දය, ධනපාලනන්දය,** යන නව නන්දරජුන් හා **චන්ද්‍රගුප්තය, බින්දුසාරය** යන මේ එක්විසි රජුන් ඇවෑමෙන් පැළලුප්නුවර මහත්වූ කුශලබල වික්‍රමඇති ආඥාචක්‍රවර්තිවූ **ධර්මාශොක** නම් මහ රජෙක් සිතුමිණිරුවනක්සේ පැනනැඟී අප බුදුන් පිරිනිවි දෙසිය අටළොස්වන අවුරුදු දසදහසක් යොදුන් දඹදිව්තලෙහි එකච්ඡත්‍රනංවා රාජ්‍යාභිෂෙකප්‍රාප්තව අහසින් යොත්නෙක පොළොවින් යොත්නෙක අවටින් සාගර පර්යන්තව යශස් තෙජස් පතුරුවා සුවාසූදහසක් මහරජුන් හා සමඟ මහ සෙනඟ පිරිවරා අමරගණානුබද්ධ දෙවෙන්ද්‍රවිභ්‍රමයෙන් රාජ්‍යශ්‍රී විඳිනේ මුළුදඹදිව ඒ ඒ රාජධානිවල චෛත්‍යාඞ්ගණ බොධ්‍යඞ්ගණ ප්‍රතිමාගෘහ ධර්මශාලා ප්‍රාසාද චඞ්ක්‍රමණ ප්‍රාකාර ගොපුර පුෂ්කරිණී පුෂ්පාරාම ඵලාරාමාදීන් ප්‍රතිමණ්ඩිතවූ සුවාසූදහසක් රජමහාවිහාර කරවා ධාතුකොත් පිහිටුවන පූජාදිනයෙහි අශොකාරාමයට රැස්වූ අනූලක්ෂයක් ක්ෂීණාශ්‍රවාදි භික්ෂුණීන් හා අසූකෙළක් මහරහත්

ආදි භික්ෂූන්වහන්සේගේ* මධ්‍යයෙහිසිට ඒ මහරහතන්ගේ ලෝක විවරණ මහාප්‍රාතිහාර්‍ය්‍යානු භාවයෙන් සාගරපර්‍ය්‍යන්තවූ මුළු දඹදිව්තලය අයතනයෙන් බලා සියලු විහාරවල පවත්වනලද උදාරතරවූ පූජාසත්කාර දැක මහත්වූ ප්‍රීතිප්‍රමොද රසාස්වාදයකොට ශාසන දායාද සඳහා ප්‍රධාන පුත්‍රවූ විසිහැවිරිදි **මිහිඳුකුමාරයන්** හා අටළොස්හැවිරිදි **සඞ්ඝමිත්‍රා** නම් කුමාරිකාවන් හා දෙදෙනා මහණකරවා දවස පස්ලක්ෂයක් ධනවියදමින් බුද්ධශාසනයෙහි මහත්වූ ලාභසත්කාර පැවැත්විය.

එකල තීර්ථකයෝ ලාභසත්කාර සඳහා සසුන්වන්නාහු තමන්ගේ මිථ්‍යාදෘෂ්ටියම ධර්මවිනය නම් වේයයි උසස්කොට දක්වමින් ඇවිදිනාහ. පැවිදි නොලබන තීර්ථකයෝ තුමූම හිසකේ කපා කසාපිළී පෙරෙව ඒ ඒ විහාරයට වැද වෙසෙමින් පොහෝපවුරුණු කරන සඟමැදට වදනාහු භික්ෂූන් විසින් ධර්මවිනයාදීන් නිග්‍රහ කලද ශාසනානුකූල ප්‍රතිපත්තියෙහි නොපිහිටා අනෙකප්‍රකාර දුලබ්ධි උදභාවනා කෙරෙමින් ඇවිදිනාහුමය. එසේහෙයින් සත් අවුරුද්දක් මුළුල්ලෙහි සිල්වතුන්වහන්සේගේ සඞ්ඝසාමග්‍රී විශුද්ධියට කාරණවූ පොහෝපවුරුණු නැතිව බොහෝසේ ශාසනය පසුබස්නට†වන. එකල ධර්මාශොකමහරජාණෝ එපවත් අසා බ්‍රහ්මලොකාගත **මොග්ගලිපුත්තතිස්ස** මහතෙරුන්වහන්සේ කරාඑළඹ සත්දවසක් විහාරයෙහිමරඬ සියලු සමයාන්තර ඉගෙන එම සත්දවස ඇතුළත යකුන් දෙදනකු ලවා මුළු දඹදිව සියලු මහා සඞ්ඝයා ගෙන්වා තමන් නමින් කරවූ පැළලුප්නුවර අශොකාරාම නම් විහාරයෙහි රැස්කරවා සමානලබ්ධිකයන් වෙන වෙනම සිටුවා ලබ්ධිභෙද විචාරා **සස්සතවාදය, එකච්චසස්සතවාදය, අන්තානන්තිකය, අමරා විකෙඛපිකය, අධිච්ච' සමුප්පන්නකය, සඤ්ඤීවාදය, අසඤ්ඤීවාදය, නෙවසඤ්ඤීනාසඤ්ඤීවාදය, උච්ඡෙදවාදය, දිට්ඨධම්මනිබ්බානවාදය**" යනාදිවූ වාද ගෙන මහණවෙසින් වසන ශඨ කූට කෛරාටික ලුබ්ධමායාවී සැටදහසක් පමණ තීර්ථකයන් සස්නෙන් පහකරවා ශාසනය ශුද්ධකොට වෙහෙර සිසාරා රැකවල් ලවා විභජ්ජවාදිවූ සිල්වතුන්වහන්සේ ලවා සමඟි පොහොය කරවා එතැන්හි රැස්වූ සැටලක්ෂයක් පමණ රහතන් වහන්සේ අතුරෙන් මොග්ගලිපුත්තතිස්ස මහතෙරුන්වහන්සේ

---

* මෙහි ක්ෂීණාස්‍රව මෙහෙණිහු දහසෙක. ක්ෂීණාස්‍රව භික්ෂූහු ලක්ෂයෙකි—විභාගට්ඨකථා; මහාවංශ.

† පිරිහෙන්නට-ඇතම්.

ප්‍රධානකොට ඇති දහසක් පමණ රහතන්වහන්සේ ලවා නවමසකින් ධර්මසඞ්ගායනා කරවා ලජ්ජිබලය පෙරදැරිකරවා බුදුසසුන් පැවැත්වූහ.

එසේහෙයින් කියනලදී :—

"යා සට්ඨිතිත්ථියසහස්සනිසාගතනතං
දුල්ලඞ්ඝොරතිමිරං විනිහච්ච සම්මා,
සා තිස්සථෙරරවිනා ගමිතා විකාසං
සඞ්ගීතිචාරුනලිනී අපි දස්සිතා මෙ."

එකල්හි ශාසනයෙන් පහකරනලද තීර්ථකයෝ ශාසනප්‍රතිෂ්ඨා නොලදින් නික්මුණාහු ක්‍රොධයෙන් දිලිහී රජගහානුවර සමීපයෙහිවූ නාලන්දාවෙහි රුස්ව "ජනයන් ශාසනාවගාහ* නොකරන පරිද්දෙන් ශාක්‍ය භික්ෂූන්ගේ ධර්මවිනය දෙක බිඳවූව මැනව, එද වනාහි ඔවුන්ගේ සමයභෙද නොදන්න නොපිළිවන. එබැවින් කිසියම් උපායකින් යළිදු මහණවූව මැනවැ" යි ඔවුනොවුන් හා මන්ත්‍රණය කොට පෙරළා අවුත් ථෙරියනිකායවාසීන් කරා වැද්ද නොහී එයින් හළ මහාසඞ්ඝිකාදිවූ සතළොස් නිකායවාසීන් කරා එළඹ තමන් තීර්ථකබව නොහඟවා මහණව තුමූද පිටකත්‍රය අසා පිරිවහා විපරියාසකොට පෙරළාගෙන, ඉක්බිති කොසඹෑනුවරට ගොස් ධර්මවිනය බිඳිනාක්‍රම බැණගෙන බුදුන් පිරිනිවී දෙසිය පන්තිස් අවුරුද්දක් ගියකල සරුසක්ව බෙදී සතෙනෙක වෙසෙමින් "**හෙමවතාය**, **රාජගිරිය**, **සිද්ධාර්ථිකාය**, **පූර්වශෛලීය**, **අපරශෛලීය**, **වාජිරිය**, **වෛතුල්‍යය**, **අන්ධකය**, **අන්‍යමහාසාඞ්ඝිකාය**" යි නවනිකායෙක්වූහ. එයින් හෙමවතයෝ බුදුන් වදාළනාක් මෙන් සධර්මප්‍රතිරූපකොට **වර්ණපිටකය** කළහ. රාජගිරීහු **අඞ්ගුලිමාලපිටකය** කළහ. සිද්ධාර්ථිකයෝ **ගූඪවෙස්සන්තරය** කළහ. පූර්වශෛලීහු **රට්ඨපාලගර්ජිතය** කළහ. අපරශෛලීහු **ආලවකගර්ජිතය** කළහ. වජ්‍රපර්වතවාසීහු **ගූඪවිනය** කළහ: තවද ඔහුම **මායාජාලතන්ත්‍රය**, **සමාජතන්ත්‍රය**, **මහාසමයතත්වය**, **තත්වසඞ්ග්‍රහය**, **භූතචාමරය**, **වජ්‍රාමෘතය**, **චක්‍රසංවරය**, **ද්වාදශචක්‍රය**, **හෙරුකාද්බුදය**†, **මහාමායාය**, **පදනිඃක්ෂෙපය**, **චතුෂ්පීඨය**, **පරමාද්‍යය**, **මරීච්‍යුද්භවය**, **සර්වබුද්ධය**, **සර්වගුහ්‍යය**, **සමුච්චයය**, යනාදිවූ තන්ත්‍රද, **මායාමරීචිකල්පය**, **හෙරම්බකල්පය**,

* ශාසනසඞ්ග්‍රහ-ඇතම්. † හෙරුකාත්බුදය-ඇතම්.

**ත්‍රිසමයකල්පය, රාජකල්පය, වජ්‍රගන්ධාරකල්පය, මරීචිගුහ්‍යකල්පය, ශුද්ධ සමුච්චයකල්පය,** යනාදිවූ කල්පශාස්ත්‍රද ඉපදවූහ.

වෛතුල්‍යවාදීහු **වෛතුල්‍යපිටකය** කළහ. අන්ධකයෝ **රත්නකූටාදිවූ** ශාස්ත්‍රාන්තර රචනා කළහ. අන්‍යමහාසාංඝිකයෝ **අක්ෂරසාරියාදිවූ** සූත්‍රාන්තර රචනා කළහ. ඔවුන් ඒ ප්‍රකරණ රචනාකල ක්‍රම වෙන වෙනම දක්වත් ඉතා බෙහෙව. මෙසේ නොයෙක් ශාසනභෙද ඉපදවූවද සර්වඥශාසනය තුන්වන ධර්ම සඞ්ගායනාවෙහි පටන් දෙසිය එකුන්විසි අවුරුද්දක් නිර්මලව පැවැත්තේමය.

එකල්හි ඒ භික්ෂුප්‍රතිරූප තීර්ථකයන් විසින් උපදවනලද සද්ධර්ම ප්‍රතිරූපයන් අතුරෙන් වණ්ණපිටකාදිවූ සද්ධර්මප්‍රතිබිම්බ ජම්බුද්වීපයෙහිම නිවෘත්තවිය. වෛතුල්‍යවාදය, වාජිරීයවාදය, රත්නකූටාදි ශාස්ත්‍රය යන මෙතුන ශ්‍රීලඞ්කාද්වීපයට උපගතවිය. එද වනාහි මෙරට රජකල රජුන්ගෙන් පළමුවන **විජයරජය, උපතිස්සය, පණ්ඩුවාසය, අභාරජය, පණ්ඩුකාභයය, මුටසිවය,** යන රජුන් සදෙනා ඇවෑමෙහි සත්වැනිව උපන් **දෙවනපෑතිස්ස** නම් රජෙක් බුදුන් පිරිනිවි දෙසියසතිස්වන අවුරුදු දඹදිව ධර්මාශොක රජහට අටළොස්වන්නෙහි මෙකල රජවිය. එකල ධර්මාශොක මහාරජාණන් පුත් මිහිඳු මාහිමියන්වහන්සේ උපසම්පන්නවූ දෙළොස්වස් පිරී පොසොන්මස මැදි පොහෝදවස් මූල නැකතින් සිරිලකට වැඩ එම දෙවනපෑතිස්සරජහට පළමුවන්නෙහි මෙසිරිලක සසුන් පිහිටවූ සේක.

ඉක්බිති ඒ දෙවනපෑතිස්සරජු පටන් **උත්තියරජය, මහාසිවය, සූරතිස්සය, අස්සරගියෝය, *අසේලය, එළාරය, මහානාගය, යමාලතිස්සය, ගොළුඅභය, කාවන්තිස්සය, දුටුගැමුණුය, සැදෑතිස්සය, තුල්තන්රජය, ලැමණිතිස්සය, කළුදෑනාරජය, පඤ්චද්‍රාවිඩය**†, යන මේ සතළොස් රජුන් ඇවෑමෙහි **වළගම්අභා,** නම් මහරජෙක් බුදුන් පිරිනිවී සාරසිය එකුන්සාළිස් අවුරුදු නවමස් දසදවසක් ගියකල සිරිලක රජ පැමිණී පස්වැනි මස පරදෙසින් බට සෙබළ දෙමළුන් සත්දෙනකු හා යුද්ධකොට බිඳී වල් වන. එකල බුදුන් බෝමැඩ විදුරසුන් නැඟී මරසෙනග බිඳ බුදුවූ දවස් එම විගස ප්‍රීතිවෙගයෙන් උදන්

* සෙනය, ගුත්තිකය-මහාවංශ.

† පුලහත්, බාහිය, පණයමාර, පිළයමාර, දාඨිය, යන දෙමළරජ පස්දෙනයි.

අනාවදාළ "අනෙකජාතිසංසාරං" යන ප්‍රථම බුද්ධවචනය ආදි කොට කෙළවර පරිනිර්වාණකාලයෙහි වදාළ "වයධම්මා භික්ඛවෙ සංඛාරා අප්පමාදෙන සම්පාදෙථ" යන පශ්චිම බුද්ධවචනය අවසන් කොට මේ දෙඅතුර පන්සාළිස් අවුරුද්දක් මුළුල්ලෙහි දිව්‍යබ්‍රහ්ම නාගසුපර්ණමනුෂ්‍යයක්ෂරාක්ෂස සිද්ධවිද්‍යාධරාදීන්ට අනුශාසන පිණිස වදාළ පරිච්ඡෙදන්ම අක්ෂරවශයෙන් පදවශයෙන් ග්‍රන්ථ වශයෙන් භාණවාරවශයෙන් පරිච්ඡින්නසංඛ්‍යාසහිත අන්‍යූනව අනධිකව සර්ව දූලීබධිය හා අසම්මිශ්‍රව ත්‍රිවිධසඞ්ගායනාරූඪව ගගන ගඞ්ගාප්‍රවාහයක් සේ සුපරිශුද්ධව දැරහම්නිරුවනක් සේ නිර්මලව අමෘතමහාමෙඝයක් සේ මුළුලෝ සනහමින් ත්‍රිවිධ බොධිසම්පාදනයට සෑජු රාජපථයක්ව සකලජනකමනීය සර්වසම්පත්ති ලාභයට ඒකාන්ත කාරණව **උපාලිය, දාසකය, සොණකය, සිග්ගවය, මොග්ගලිපුත්තතිස්සය, මහින්දය, ඉට්ඨියය, උත්තියය, සම්බලය, භද්දසාලය, අරිට්ඨය, තිස්සදත්තය, කාළසුමනය, දීඝනාමය, දීඝසුමනය, කාළසුමනය, මහානාගය, බුද්ධරක්ඛිතය, තිස්සය, දෙවය, සුමනය, චූලනාගය, ධම්මපාලිතය, ඛෙමය, උපතිස්සය, ඵුස්සදෙවය, සුමනය, පුප්ඵනාමය, මහාසීවය, උපාලිය, මහානාගය, අභයය, තිස්සය, ඵුස්සනාමය, චූලාභයය, තිස්සය, චූලදෙවය, සිවස්ථවිරය,** යන මේ මහාස්ථවිර පරම්පරාවෙන් මුඛපාලිවශයෙන් පැවත ආවාවූ ත්‍රිපිටකධර්මය එක්තරා ජනපදාධිපයක්හුගේ ආරක්ෂාවෙන් පන්සියයක් රහතන් වහන්සේ මාතුල නම් දනව්වෙහි **අලුලෙන්** වැඩහිඳ පොත් සඞ්ගායනා කොට ලියවූසේක.

ඉක්බිති වලගම්අභා මහරජ තුදුස්අවුරුදු සත්මසක් ගියකල සිංහල බලසෙනඟ ගෙන දෙමළුන් මරා රාජ්‍යය එක්සත්කොට **ගිරිනම් නිවටකු** විසූ තිත්ථිකාරාමයක් විධමා තමාගේ අභය නාමය හා ඔහුගේ ගිරිනාමය එක්කොට අභයගිරිනම් විහාරයක් කරවා පූර්වොපකාරිවූ **තිස්ස** නම් මහතෙරකෙනකුන්වහන්සේට පිළි ගැන්විය. එකලට ලකසසුන් පිහිටි දෙසිය සතලොස් හවුරුදු දසමස් දසදවසක් අතික්‍රාන්තවිය.

ඉක්බිති ඒ හගිරිවෙහෙර පිළිගත් කෙම්ගලුවැසි තිස්ස මහ තෙරහු "කුලසංසට්ඨව වෙසෙති" යි මහවෙහෙර වසන සුසීල සඞ්ඝයා එක්ව ඔවුන්ට පබ්බාජනියකර්මය කරනකල්හි එම සඟ පිරිසැ හුන් ඔවුන් අතවැසි **මහදැලියාතිස්ස** නම් ශිෂ්‍යයෙක් "අප මහතෙරුන්වහන්සේට එසේ නොකළ මැනවැ" යි වැළ

කිය. එකල මොහු “අශුබානුවර්තනකයහ” යි භික්ෂූන්වහන්සේ ඕහට උත්ක්ෂෙපණීයකර්මය කළසේක. එකල එතෙම කොප යෙන් දිළිහී පන්සියක් පමණ භික්ෂූන් භෙදකොට හැරගෙන ථෙරීය නිකායෙන් භින්නව අභයගිරිවෙහෙර ගොස් වසනුයේ යටකී වජ්ජිපුත්‍රනිකායෙහි **ධර්මරුචි** නම් ආචාර්‍ය්‍යයන්ගේ ශිෂ්‍ය යන් දඹදිව් පල්ලරාරාම නම් විහාරයෙන් මෙරට අවුත් තමාකරා වන්කල්හි ඔවුන්ගේ සමය කැමැතිව ඔවුන් හා එක්ව ධර්මරුචි නම් ආචාර්‍ය්‍යව විසීය. එතැන්පටන් අභයගිරිවාසීහු **ධර්මරුචි නිකාය** නම් වූහ. මෙසේ ධර්මරුචි නම් නිකායෙක් බුදුන් පිරිනිවි සාරසිය සිවුපනස් අවුරුද්දක් ගියපසු වළගම්අභා නම් මහ රජහු දවස ඔහුට පසළොස්වන්නෙහි ථෙරියනිකායෙන් භින්නව භගිරිවෙහෙර ව්‍යාප්තවිය.

ඉක්බිති ඒ වළගම්අභා මහරජහු පටන් **මහචූළිකාතිස්සය චොරනාගය, කුඩාතිස්සය, බලත්සිවය, වටුකය, බැළ, තිස්සය, නිලීයපුරොහිතය, අනුලාය, මකලන්තිස්සය*, භාතියය, මහදැළියාග, අමඬගැමුණුය, කිණිහිරිදලය කුඩා අභාය, සිවලීය, එළුනාගය, සඳමුහුණුය, යසසිළුය, සුභබල නාය, වැහැප්රජය, වන්නැහැතිස්සය, ගජබාහුය, මහලු නාරජය, භාතියතිස්සය, චූලතිස්සය, කුහුන්නාය, කුඩා නාය, කුඩාසිරිනාය,** යන මේ එකුන්තිස් රජුන් ඇවෑමෙහි බුදුන් පිරිනිවී සත්සිය දෙපණස් අවුරුදු සාරමස් දසදවසක් ගිය පසු ධර්මව්‍යවහාරයෙහි දක්ෂවූ **ව්‍යවහාරතිස්ස** නම් රජෙක් මෙරට රජවිය.

ඒ රජහු දවස ධර්මරුචි නම්වූ අභයගිරිවාසීහු යටකී ධර්මාශොක මහරජහු දවස ශාසනය නසනු පිණිස මහණවෙස්ගත් වෛතුල්‍ය නම් තීර්ථක බ්‍රාහමණයන් විසින් උපදවනලද වෛතුල්‍යපිටකය ගෙන “බුදුන් වදාළ ධර්මය මේය” යි ප්‍රකාශකොට දක්වූහ. එකල ථෙරිය නිකායවාසීහු ධර්මවිනය හා සසඳාබලා ඒ වෛතුල්‍ය වාදය “අධර්මවාදය” යි දුරුකොටපීහ. එපවත් අසා ව්‍යවහාර තිස්ස රජ සර්වශාස්ත්‍රයෙහි කෙළපැමිණියාවූ **කපිල** නම් අමාත්‍ය යකු ගෙන විනිශ්චයකොට බලා බුද්ධභාෂිත නොවන බව දැන වෛතුල්‍යවාද ගෙන්වාගෙන දවා එගත් පාපි භික්ෂූන්ට නිග්‍රහ කොට බුදුන්ගේ පර්‍ය්‍යාප්තිශාසනය බැබළවිය. කියනලදුයේමැයි මහාවංසයෙහි :—

---

* කමලනතිය—ඇතම්.

"වෙතුල්ලවාදං මද්දිත්වා කාරෙත්වා පාපනිග්ගහං
කපිලෙන අමච්චෙන සාසනං ජෝතසීධ සො."—සි.

ඉක්බිති ව්‍යවහාරතිස්සරජු පටන් "**අභාතිස්සය, සිරිනාගය විජයින්දුය, සඞ්ඝතිස්සය, දුහැම් සිරිසඟබෝය**" යි රජ සපරම්පරාවක් ගියපසු සත්වැනිව සිරිලක රජපැමිණි **ගොඨාභය** නම් මහරජහට සතරවන්නෙහි එම නිලීජ්ජවූ ධම්මරුචි නම් අභයගිරිවාසීහු යළිදු වෛතුල්‍යවාද ගෙන "බුද්ධභාෂිතය" යි දක්වූහ. එකලට එයින් **උසිලියාතිස්ස** නම් මහතෙර කෙනෙකුන් වහන්සේ ව්‍යවහාරතිස්ස රජු දවස වෛතුල්‍යවාද ගත් භික්ෂූන්ට නිග්‍රහකළ පරිදි අසා යළිදු "විචාරවත් රජකු දවස එලෙස වුව යහපත් නොවෙයි, අපි ඔවුන් හා එක්නොවම්හ" යි සඟ තුන්සියයක් දෙනා හැරගෙන දකුණු ගිරිවෙහෙරට ගොස් ධම්මරුචිනිකායෙන් වෙන්ව විසූහ. ඔවුන් කෙරෙන් **සාගල** නම් මහතෙරකෙනෙක් එහිම හිඳ ආගම ව්‍යාඛ්‍යාන කළහ. එතැන් පටන් ඔවුන් අතවැසි එහි වසන භික්ෂූහු එම නමින් **සාගලිය** නම් වූහ. මෙසේ සාගලිය නම් නිකායෙක් බුදුන් පිරිනිවී සත්සිය පස්අනූහවුරුද්දක් ගියපසු ගොළුඅභා රජහු දවස ධම්මරුචි නිකායෙන් භින්නව දකුණු ගිරිවෙහෙර සජාතවිය, පසුව මහසෙන් රජු දවස දෙනානකවෙහෙර ව්‍යාපතවිය.

ඉක්බිති ගොළුඅභා මහරජ **පඤ්ඤුව** මහා ආවාසයෙහි මහාසඞ්ඝයා රැස්කරවා එපවත් විචාරා වෛතුල්‍යවාදය බුද්ධභාෂිත නොවන බව දැන එගත් පාපි භික්ෂූන් සැටදෙනකු තෝරා වෙර ලකුණු ඔබ්බවා දෙශත්‍යාගකරවා වෛතුල්‍යවාද ගෙන්වාගෙන දවා බුදුසසුන් බැබලවිය.

එකල දෙශත්‍යාගකළ මහණුන් සැටදෙනා අතුරෙන් සමහරු ගොස් **කාවීරපටුනෙහි** වෙසෙති. එකල්හි එක් තීජික මානවක යෙක් දෙශාන්තරයෙහි සිට කාවෙරියට අවුත් පටුන්ගම් වැස්සන් ඔවුන්ට කරන උපචාර දැක ලාභසත්කාර සඳහා ඔවුන් කෙරෙහි මහණව **සඞ්ඝමිත්‍ර** යයි යන නමින් ප්‍රසිද්ධව වසනුයේ දවසෙක වත්තෙරුන් පැන් සනහන්ට බටඳී සිවුරු අතින් ගෙන සිටියේ ඔවුන් පිට එබූ ලකුණු දැක "මේ කිමෙක්දැ" යි විචාරා "ලක්දිව ගොළුඅභා නම් රජෙක් මහාවිහාරවාසීන්ගේ බස් ගෙන අප වෛතුල්‍යවාද ගත් අභයගිරිවාසීන් සැටදෙනකු වෙර ලකුණු ඔබ්බවා දෙශත්‍යාග කරවාපිය" යි කී කල්හි "ඊට මා විසින් කුමක්

කළමනාදැ" යි විචාරා "තා සමපීචුවහොත් සතුරන්ට නොකළ මනා දෙයක් ඇද්දැ" යි කීකල්හි "යහපතැ" යි ගිවිස "මහ වෙහෙර වැස්සන් වෛතුල්‍යවාද හෝ ගන්වමි, ඔවුන්ගේ විහාර හෝ මුලිනුදුරුවා නස්වාපියමි" යි සැහැසිව සිංහලයට බැස ගොළුඅභා රජු සිත්ගෙන ඔහු පුත් "**දෙටතිස් කුමරු** හා **මහසෙන් කුමරු** හා දෙදෙනා ශාස්ත්‍ර උගන්වමි" යි පටන්ගෙන නවම නවම දන්නා දෙටතිස් කුමරු හැර බාලවූ මහසෙන් කුමරු ගෙන මතු තමා සිතන කටයුත්තට කීවා කරවාගන්නා පිණිස ශාස්ත්‍ර ඉගැන්විය. ගොළුඅභා මහරජතෙමේ තෙළෙස් අවුරුද්දක් දැහැමෙන් රාජ්‍යයකොට ජන්මාන්තරගත විය.

එකල සඞ්ඝමිත්‍රයා දෙටතිස් කුමරු කෙරෙහි භයින් සොළීරට ගොස් කාවීර පටුනෙහි වසනුයේ දෙටතිස් කුමරු රජවී දස අවුරුද්දක් දැහැමින් රාජ්‍යයකොට පරලෝ ගියකල්හි එපවත් අසා නැවත ලක්දිව් බැස භගිරිවෙහෙර වෙසෙමින් නොයෙක්ලෙස උත්සාහකොට පඤ්චමහාවිහාරවාසින් වෛතුල්‍යවාද ගැන්විය නොහී බුදුන් පිරිනිවී අටසිය අටළොස්වන අවුරුදු සිරිලක රජ පැමිණි තමා ශිෂ්‍යවූ **මහසෙන්රජු** කරා එළඹ නොයෙක්ලෙස කාරණ කියා සිතට නංවා "මහවෙහෙර වැසි මහණක්හට අහරක් දුන් කෙනෙක් ඇත්නම් සියක් දඩය" යි රජුගේ විධානයෙන් නුවර බෙර ලැවීය. එකල මහාවිහාරවාසීහු නුවර බැස තුන්දවසක් සිඟා ආහාර නොලදින් ලෝවාමහපායට රැස්ව "අපි ඉදින් සයින් වී නමුත් අධර්මය ධර්මයයි ගතුමෝනම් බොහෝ දෙන එම ගෙන අපායගත වෙති; අපි ඇමද සාපරාධ වම්හ. එබැවින් අපි අපගේ ජීවිත බ්‍රහ්මචර්‍ය්‍යාවට අන්තරාය වේ නමුදු වෛතුල්‍යවාද නොගනුම්හ" යි කථාකොට මහාවිහාරය, මිරිස වැටිවිහාරය සැගිරිය ඇතුළුවූ හාත්පස හැම විහාරවලම සිල්වත් භික්‍ෂූහු විහාර හැර රුහුණු ජනපදයට හා මලයදෙශයටද වැඩියාහ. එකල පාපමිත්‍රවූ සඞ්ඝමිත්‍රයා **සෝණ** නම් අමාත්‍යයකු උපස්ථම්භකරවාගෙන රජහට කියා ලෝවාමහපාය ඇතුළුවූ තුන්සිය සිව්සැටක් පමණවූ පිරිවෙන් මහපා මුලිනුපුරුවා නස්වා විහාරභූමිය සාවා උඳු වපුරවාපිය. එකල භගිරිවෙහෙර වැසි ධර්මරුචිහු ගොස් සැගිරියෙහි විසූහ. කියනලදුයේමැයි මහාවංසයෙහි :—

"මහාවිහාරෙ පාපෙන මහාසෙනෙන නාසිතෙ
වසිංසු ධම්මරුචිකා භික්ඛූ චෙතිය පබ්බතෙ"—යි.

පසුව ඒ මහසෙන්රජ **මෙඝවණ්ණ අභය** නම්වූ කල්‍යාණමිත්‍ර අමාත්‍යයකුගේ සත්පුරුෂ සමාගමයෙන් නැවතමහාවිහාරයකරවා ඒ ඒ දිග වැඩි භික්ෂුසඞ්ඝයා ගෙන්වාගෙන සිව්පසයෙන් උපස්ථාන කෙළේය. ඒ රජහුගේ අගබිසෝ තනතුර සිටි රාජවල්ලභ ලැමැණී දුවක් ථූපාරාමය කරවන්නී වඩුවකු ලවා සඞ්ඝමිත්‍රයාගේ හිස සිඳුවා උල තබ්බවා වෛතුල්‍යවාද ගෙන්වාගෙන දවාපුව. නුවර වාසීහු කිපි සඞ්ඝමිත්‍රයාහට උපසතමහව සිටි **සොණ** නම් අමාත්‍යයාගේ ගෙය බිඳගෙන වැද ඔහු මැඩ මරා කසළගොඩට ඇදපිහ. එකල මහසෙන්රජ සඞ්ඝමිත්‍රයා මළද පාපමිත්‍ර සංසර්ගය නිසා සුසිලදුස්සීලයන් නොහැඳින දකුණු ගිරිවෙහෙර වසන වඞ්ක සිත්ඇති **කොහොන්තිස්ස** නම් මහතෙරුන් කෙරෙහි භක්ති උපදවා ඔවුන්ට මහවෙහෙර සිමින් ඇතුළත ජෝතියවන උයන්හි දෙනාවෙහෙර කරවන්ට පටන්ගත. එකල්හි මහවෙහෙර වසන භික්ෂූහු "ඇතුළු සිමැ නානා සංවාසකයන්ට විහාර කළ නොහැක්කැ" යි වළක්වත්දිත් බාලරජහු භගිරිවෙහෙර වාසීන්ගේ බස් ගිවිස "එසේවුව සීමා ඉගුළුව මැනවැයි" නියෝගකළ කල්හි "ශාසනාන්තය දක්වා පවත්නා සීමාව අපි නුගුළුවම්හ" යි රහසින් සඟ සත්නමක් බිම්ගෙයක රඳවා විහාරය හැර ගියහ. එකල දෙනානකයෙහි භික්ෂූහු "සීමා උගුළුවම්හ" යි පටන්ගත්හ. එපවත් අසා සිතුල්පව්වෙහෙර වසන අභිඥලාභිවූ හෙරණ කෙනකුන්වහන්සේ රාක්ෂසවෙශයක් මවාගෙන යගදුවක් අතින් ගෙන අමෝරා පිරිස් මැදට වැද දෙනානකයෙහි භික්ෂූන් ඒ ඒ අත ලුහුබඳවා නුවර බලා නික්මුණුසේක. මහසෙන්රජ එපවත් අසා "දූන් ඔහට කුමක් කළමනාදැ" යි විචාරා "මහාවිහාර වාසිවූ භික්ෂු සඞ්ඝයා දූක මිස මෙතනින් නොනවත්නේය" යි කීකල්හි එයින් "භික්ෂූන්වහන්සේබලා වහාගෙනෙව" යි නියොග කෙළේය.

එකල්හි රජුගෙන් නියොගලත් අමාත්‍යයෝ භූමිගෘහයෙහි පලමුව රහස්ව වැඩහුන් රහත් සත්දෙනාවහන්සේ ගෙනහැර දැක්වූහ. එකෙණෙහි රාක්ෂසවෙශයෙන් ආවාවූ සාමණේරයන් වහන්සේ අතුරුදන්ව සිතුල්පව්වෙහෙරටම වැඩිසේක.

එකල රජ සිම් ඉගිළවියනොහී සීමාව ඇතුළත දෙනාවෙහෙර කරවා කොහොන්තිස්ස මහතෙරුන්වහන්සේටම දින. ඉක්බිති ඒ තිස්ස තෙරුන්වහන්සේට අන්තිම වස්තුවෙන් සඟමැද චොදනා උපන් කල්හි රජහුගේ **ධාර්මික** නම්වූ අධිකරණ අමාත්‍යයෙක්

විනිශ්චයකොට බලා විද්‍යමාන චොදනාවන හෙයින් රජහු නොකැමැතිවූවද මහතෙරුන් දැහැමින්ම සිවුරු හැරවිය. කියනලදුයේ මැයි මහාවංසයෙහි :—

> "තස්ස විහාරගාහිස්ස තිස්සත්ථෙරස්ස චොදනා
> අන්තිමවත්ථුනා ආසි භූතත්ථා සඞ්ඝමජ්ඣගා.
> විනිච්ඡිය මහාමච්චො තදා ධම්මිකසම්මතො
> උප්පබ්බාජෙසි ධම්මෙන තං අනිච්ඡාය රාජිනො"—යි.

එකල සාගලිහු දකුණු ගිරිවෙහෙරින් අවුත් දෙනාංවෙහෙර වැස පසුව **අඹහෙරණසලමෙවන්රජු** දවස වෛතුල්‍ය ප්‍රාප්ත වූහ. කෙසේදයත්:—මෙකී මහසෙන්රජු පටන් **කිත්සිරිමෙවන් රජය, දෙටුතිස්සය, බුජස් රජය, උපතිස්සය** යන මේ පස් රජුන් ඇවෑමෙහි **මහානාම** නම් රජෙක් මෙරට රජවිය. එකල විශුද්ධ බුද්ධීන් ප්‍රසිද්ධවූ **බුද්ධඝොෂ** නම් අටුවාකතීඃන්වහන්සේ දඹදිවින් මෙරට වැඩිසේක් බුදුන් වදාළ දෙලක්ෂ පන්සැත්තෑදහස් දෙසියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් ඇති ත්‍රිපිටක පාලිධර්මයට තුන්ලක්ෂ එක් සැටදහස් සත්සිය පනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් පමණ අටුවා ලියා පාලිධර්මය බැබලවූසේක.

ඉක්බිති **සෙන්ගොත් රජය, ලැමැණිතිස්සය,*** **මිත්සෙන් කරල්සොරය, ෂඩ්ද්‍රාවිඩය,**† **දාසෙන්කැලිය, සීගිරිකසුබුය, මුගලන් රජය, කුමාරදාසය, කීර්තිසෙනය, මැදිසිව් රජය, ලැමැණිඋපතිස්සය** යන මේ සොළොස් රජුන් ඇවෑමෙහි බුදුන් පිරිනිවී විතීය වර්ෂ සහස්‍රයෙහි‡ **අඹහෙරණසලමෙවන්** නම් රජෙක් මෙරට රජවිය. ඒ රජහට දොළොස්වන්නෙහි මේ රටින් කසිරට ගිය **පූර්ණ** නම් වෙළඳ පුත්‍රයෙක් වෛතුල්‍යවාද ලියූ පොතක් ලැබ "සැබෑ ධර්මයෙකැ" යි සිතා මෙරට ගෙනවුත් රජහට පඬුරුකොට දින. එකල එරජ පෙර රජුන් සේ ධර්මාධර්ම විභාග දන්නට අසමර්ථව අභයගිරිවාසීන් හා මන්ත්‍රණයකොට දෙනාවෙහෙර වෛතුල්‍යවාද (පොත) ගෙන තබා භික්ෂූන් ඊට සත්කාර කරනසේ විධානකෙළේය. එකල දකුණුගිරි වෙහෙරින් අවුත් දෙනාවෙහෙරවසන සාගලීහු "පෙර රජුන් දවස වෛතුල්‍යවාද ගත් භික්ෂූන්ට නිග්‍රහකොට දෙශ ත්‍යාගකරවූහ" යි යනු අසා වෛතුල්‍යවාද පුදයට මනෙදාත්සාහි වූහ. එකල අභයගිරිවාසීහු

---

* ඡත්තගාහක-මහාවංශ.

† පණ්ඩුය, පාරින්දය, කුඩාපාරින්දය, තිරීතරය, දාඨියය, පීඨියය, යන සදෙනයි. ‡ දෙවැනි දහස ආරම්භයෙහි—1077 වන්නෙහියයි හැඟේ.

අවුත් කාරණ කියා ගිවිස්වා පැහැයෙන් එක්වැනි හෙයින් දඹයයි දක්වා බාලදරුවන් කුරුවණුවන් කවන අධමයන්සේ දෙනා වෙහෙර වැසි අඥාන මහණුන් ලවා සත්කාර කරවූහ. එතකුදු උවත් මහාවිහාරවාසින් හා අනුරාධපුර වාසින්ගෙන් නුවණැති බොහෝදෙන සත්කාර නොකළාහුමය.

ඉක්බිති දඹදිවින් බට **ජෝතිපාල** නම් ආචාර්‍ය්‍ය මහාස්ථවිර කෙනෙක් වෛතුල්‍යවාදීන් මර්දනයකොට තමන් දවස ලක්දිව් තෙලෙහි වෛතුල්‍යවාද ඉනාපවත්නාසේ නිග්‍රහකළහ. කියනලදුයේමැයි චූළවංසයෙහි :—

"තදා එකො මහාථෙරො ජෝතිපාලසනාමකො,
පරාජෙසි විවාදෙන දීපෙ වෙතුල්ලවාදිනො."*—යි.

ඉක්බිති ඒ නිකායවය වාසීහු† වෛතුල්‍යවාද ගන්නවුන් නැති හෙයින් රජගෙයි වසන පුරුෂයකු සිත්ගෙන අසනතැන් කියන මැතියක්හට වියත්නා තනතුරු ගෙන දී ඔහු ලවා රජහට වෛතුල්‍යවාද දැක්වූහ. ඔහු මළපසු දෙනකයෙහි භික්ෂූහු නිහත මානිව මහාවිහාරවාසීන්ට අවනතව විසූහ. මෙසේ වෛතුල්‍ය වාද තුන්වරෙක ලක්දිවට පැමිණ පරම බෞද්ධ රජුන් විසින් ව්‍යව ඝිතවූයේ මෙරට ශාසනය පිහිටි අටසිය දෙපනස් අවුරුද්දක් ගිය පසු බුදුන් පිරිනිවී එක්දහස් අටඅසූ අවුරුද්දක් පිරුණුසඳ සතර වනවර ඒ පූර්ණනම් වෙළඳපුත්‍රයා විසින් ගෙනෙනලදුව අඹහෙ රණසලමෙවන් රජු දවස පටන් මෙරට බාලජනයන් කෙරෙහි පැවැත්තේය.

ඉක්බිති අඹහෙරණසලමෙවන් රජු පටන් **දැසුළුසෙන්රජය දළමුගලන්ය, කුඩාකිත්සිරිමෙවන්ය**, **සෙනෙවිමහනාරජය**, **ලැමැණිසිඟානාය** යන මේ සරජුන් ඇවැමෙහි **අග්‍රබොධි** නම් රජෙක්විය. ඔහු දවස සක්දැමලය, අසක්දැමලය, දූමිය, බැබිරිය, දළබිසෝය, අනුරුත්කුමරුය, දළගොත්කුමරුය, දළසලකුමරුය, කිත්සිරිකුමරුය, පුරවඩුකුමරුය, සූරියබාහුය, කසුප්කොටඇපාය යන මේ දොළොස් මහාකවීහු ඇතිවූහ.

ඉක්බිති අක්බෝරජු පටන් **කුඩාඅක්බෝරජය, සඞසතිස්සය, ලැමැණිබෝනාය, අසිගගාහකාය, සිරිසඟබෝය, ලමැණි කාවුසරය**, ‡ **දළුපතිස්සය, පැසුළුකසුබුය, දැසුළුරජය,**

---

* මුද්‍රණයකරනලද මහාවංශයෙහි මේ ගාථාව අන්තැනෙක පෙණේ. 42 පරිච්ඡෙදයේ 35වෙනි ගාථාවයි. † නිකායවාසීහු-ඇතම්. ‡ "දෙවුතිස" කියමනා තැනි ඇතම් පොතක "වචුරය."

**ලැමැණිදළුපතිස්සය, පැසුළුදළුපතිස්සය, පැසුළුසිරිසඟ බෝය, වල්පිටිවසුදත්තය, හුණන්නරුරියන්දළුය, මහ ලැපාණෝය, අග්‍රබොධිය, සුළුකසුබුය, පැසුළුඅක්බෝය, කුඩාඅක්බෝය, සලමෙවන්මිහිඳුය, උදයරජය,*** **සෝමිහි ඳුය, මැදිඅක්බෝය, කුඩාදපුළුය, පැසුළුඅක්බෝය** යි මෙසේ පස්විසි රජකෙනකුන් රජයකළ ඉක්බිති ලක සසුන් පිහිටි එක්වාදහස් එක්සිය සවිසි අවුරුද්දක් ගියකල බුදුන් පිරිනිවි එක්වාදහස් තුන්සිය දෙසැට අවුරුද්දක් පිරුණුසඳ යුත් වියතුන් නොහසළ **මත්වලසෙන්** නම් රජෙක් මෙරට රජවිය. එරජු දවස වජ්‍රපර්වත නිකායවාසීවූ භික්ෂුප්‍රතිරූප තීර්ථකයෙක් දඹදිවින් මෙරට අවුත් විරාඞ්කුරනම් ආරම්භ වසනුයේ තමා ගෙන ආ රත් රන් පසලොස් කලඳක් රජගෙයි වසන ගිරිවසැසෙන් නම් අරක් කැමියක්හට දී ඔහු ලවා තමාගේ ගුණ රජහට කියවිය. එකල රජ ඔහු ගුණ අසා රත්රනැයි සිතා ගිනි වදනා පළඟක්හු සෙයින් ඒ නිවටහු කරා එළඹැ රහස් බණකැයි සඟවා ඔහු විසින් කියනලද අධර්මවූ වාජිරියවාදය ගෙන කෙළසුවහසක් සක්වළ ආඥාපැතිර දිලියෙමින් සිටි රතනසූත්‍රාදි ධර්මය දුරුකොට එම අධර්ම සමාදානය නිසා ලත්තැනින් ඉගිළ දෙමළුන්ට නුවර දී පොළොන්නරු ගොස් ජන්මාන්තර ගතවිය. රත්නකූටාදිවූ ශාස්ත්‍රද එසමයෙහි ලක්දිවට බට.

ඉක්බිති ඒ මත්වලසෙන්රජු ඇවැමෙහි සිරිලක රජපැමිණි **මුගසින්සෙන්** නම් මහරජෙක් සිංහල බලපිරිස් ගෙන දිවගොස් පාඬිරජය පැහැර දෙමළුන් මරා ලුහුබැඳ මත්වලසෙන් රජු දවස ගෙන ගිය ජයබෙර මිණිපා හැරගෙන ලක්දිව් බැස ලෝවාමහ පාය කටුකොහොල් පෙරළා කරවා එහිම සුන්බුන්කරවා තුන්ත කය දහම් ගන්වා ලෝසසුන් සෙමෙහි තබා සද්ධර්මප්‍රතිරූප ලක් දිව වැද්ද නොදෙනසේ කරය වටා රුකවල් ලවා දැහැමෙන් රජය කෙළේය. කියනලදුයේ මැයි චූලවංසයෙහි :—

“ සද්ධම්මපතිරූපානං දිස්වා ලොකෙ පවත්තනං,
ගණ්හාපෙසි තථා රක්ඛං සාගරෙන සමන්තතො—”යි.

එතකුදුළුවත් වාජිරියවාදය රහස් බණියයි සඟවා පරිහරණ කොට රක්නාහෙයින් මත්වලසෙන් රජහු පටන් මෙරට ලාමකවූ අඥානයන් කෙරෙහි පැවැත්තේය. නීලපටදර්ශනය වනාහි ප්‍රකාශ යට ගියහෙයින් ශේෂවිය. කෙසේදයත් :—

---

* දපුළුට ගණු මහාවංසයි.

මෙරට යටකී කුමාරදාස රජු දවස දඹදිව දක්ෂිණ මධුරාවෙහි **ශ්‍රීහර්ෂ** නම් රජෙක්විය. එකල සම්මිතතීය නිකායවාසිවූ නුවණැති සැදැහැනැති දුෂ්ට මහණෙක් රාත්‍රිභාගයෙහි නිල් වස්ත්‍රයක් පෙරෙව වෙශ්‍යාවාසයකට ගොස් එහි ලැග පහන්ව ගියකල විහාර යට ආයේය. ඔහුගේ ශිෂ්‍යයෝ එබව දැක "මේ වෙශය යහපත් දැ?" යි විචාළහ. එකල ඒ තමා ගත් වෙශය බොහෝදෙනා දුටුහෙයින් එම ප්‍රශංසා කොට එහි අනුසස් කීය. එතෙපුල් අසා ඔහුගේ වචනකර භික්ෂූහු සිවුරු හැර නිල්පිළී පෙරවියහ. ඉක්බිති එතෙම "විදග්ධ වෙශ්‍යාඞ්ගනාවන් හා අනවස්ථිත සුරාපානය හා කාමදෙවයා හා තුන භුවනත්‍රයෙහි අසාධාරණ රත්නය" යි තබාගෙන ඊට නමස්කාරකෙරෙමින් සෙසු රත්නයන් කදපහණසේ නිසරුකොට දක්වා "නීලපටදර්ශන" නම්වූ ග්‍රන්ථ රචනාවක් කෙළේය. කීයේමැනො—

"වෙශ්‍යාරත්නං සුරාරත්නං රත්නං දෙවො මනොභවඃ,
එතද්‍රත්නත්‍රයං වන්දෙ අන්‍යත් කාචමණිත්‍රයම්"—යි.

මෙසේ නීලපටදර්ශනය ව්‍යාපතවන්ට පටන්ගත්කල්හි ශ්‍රීහර්ෂ දෙවයෝ ඒ ගෙන්වාගෙන කියවා බලා—

"න කිං පිබසි දුර්මේධ නරකං ගන්තුමිච්ඡසි,
ලවණොදකසංයුක්තාස්සුරාසස්වගේහ'පි දුර්ලභාඃ"

යන මේ අව්‍යවස්ථිත ග්‍රන්ථය දැක "මේ වනාහි ධර්මයෙක් නොවෙයි ශාසනභෙදයෙකැ" යි දැක "මාවැනි ආඥාචක්‍රවර්තීහි යක්හු මීට උදාසීනවූව හොත් බුදුසස්න නස්නේය, බොහෝ සත්හු මේ ගෙන අපායභාග්වෙති, පස්වා දහසක් පවත්නා බුඬශාසනයට මා පිටිවහල් වුව මැනවැ" යි සිතා ඒ දර්ශනයෙහි පහන් එකක්හු මෙන් නීලපටධරයන් හා ඔවුන්ගේ පත් පොත් ගෙන්වාගෙන පත් පොත් හා සමග ඔවුන් පායෙක ඇතුළුකොට අගනිපූජා කළහ. එකල එයින් වැරදගිය ශෙෂය මුල් නුසුන් ව්‍යාධියක් මෙන් මෙවක් පෙරවා පැවැත්තේමය.

ඉක්බිති යටකී මුගයින්සෙන් රජු කෙරෙහි පටන් සිරිලක රජ කළ **උදරජය, කසුප්රජය, පැසුළුකසුබුය, දපුලුරජය, කුඩා දපුලුරජය, උදයරජය, සෙන්රජය, උදමහරජය, පැසුළු සෙන්රජය, මැදිසෙන්රජය, කුඩාමිදෙල්රජය, සලමෙවන් රජය, මිහිඳුරජය, විකුමබාහුරජය, මහලේරජය, වික්‍රමපාණ්ඩි**

**රජය**, **ජගත්පාලය**, **පරාක්‍රමපාණ්ඩ්‍ය**, **ලොකෙශ්වර සෙනෙවිය**, යන මේ එකුන්විසි රජුන් ඇවෑමෙහි සිරිලක රජ පැමිණි **මහලු විජයබාහු** නම් මහරජාණෝ සයාසූ හවුරුද්දක් මුළුල්ලෙහි ලක්දිව ගම්නියම්ගම් රාජධානි පුරා උන් දෙමළ මහසෙනඟ සාධා සිරිලක එක්සත් කොට "ශාසනප්‍රතිෂ්ඨාව පිණිස මළුකම් කරවමි" යි පටන්ගෙන ගණපූරකයට යටත්පිරිසෙයින් සිල්වත් සඟ පස්නමක් පමණ නොලදින් කලකිරුණාවූ සිත්ඇතිවැ ලක්‍ෂ ගණින් මුතු මැණික් දෙශාන්තරයට යවා අරමණරට වැසි ස්ථවිර පදප්‍රාප්ත සිල්වත් සඟ විසිනමක් හා පත් පොත් ගෙන්වාගෙන මළුකම් කරවා ලක්දිව නොයෙක් දහස්ගණින් මහාසඞ්ඝයා ඇති කරවා ශාසනය වර්ධනකරවූහ.

ඉක්බිති ඒ මහලු විජයබාහුරජහු පටන් **ජයබාහුය**, **වික්‍රමබාහුය**, **ගජබාහුය**, යන මේ තුන්රජුන් ඇවෑමෙහි අප බුදුන් පිරිනිවී එක් දහස් සසිය සයානූ අවුරුද්දක් ගියපසු සිරිලක රජ පැමිණි මහාසම්මත පරම්පරානුයාත රාජවංශොද්භූත රාජාධිරාජ නෛකදිගන්තව්‍යාප්ත යශොමරීචිමාලාවෙන් විරාජමානවූ ශ්‍රීසඞ්ඝබොධි **ශ්‍රීපරාක්‍රමබාහු** නම්වූ මහලු මහරජාණෝ රාජ්‍යශ්‍රී පුරුදුව උදාරතර කුශලානුභාවයෙන් යුක්තව තුන්සිය සිව්සැටක් පමණ වන්නිපත්තු සාධා ඞීපචක්‍රවර්තීත්ව පළමු අන්‍යොන්‍ය විවාදයෙන් නැසුණු ලක්දිව ඇති විචර සිංහල සෙනඟ රැස්කරවා සූවිසිලක්‍ෂ පස්විසි දහසක් පමණ රන්සිරිබන් අගම් පඩිසෙනඟ හා එසේම ජයවිරිදු ලා සිටින නවලක්‍ෂපසානූ දහසක් පමණ නැවැණි මහ සෙනඟ හා සමඟ කොට දෙබළ මහසෙනඟ අතුරෙන් සියෙන් දසදෙනා බැගින් තෝරා එක්විසිලක්‍ෂ පස්විසි දහසක් පමණ සිංහල යොධයන් දෙශාන්තරයට යවා සොළීපාණ්ඩිරජයෙහි පටන් අරමණය දක්වා යුධයෙන් සාධා ස්වදෙශදෙශාන්තරදෙක්හි එක පැහැර අණසක පතුරුවා "ශ්‍රීලඞ්කාද්වීපයෙහි බහුනායකත්වය නොකරනසේ රාජ්‍ය සූත්‍රය* පවත්වමි" යි සිතා අධිකාර සෙනෙවිරත් ඇපා මාපා මහලැණ මහරැටිනා අනුනා සභාපතිනා සිටුනා සිරිත්ලේනා දුලේනා වියත්නා මහවෙදනා මහනැකතිනා දහම් පසක්නා යන මෙකී ප්‍රධාන ප්‍රවෘත්තියද වියත්පත් අටගණයද අට මඩිගයද සතරමුදලද නියමකොට අටකුරුවද දෙනවදහසක් ගත්තරඉවරද යන මෙකී සියල්ල අඛණ්ඩව පැවැත්ත මැනවැ" යි ව්‍යවස්ථා කරවා මහත් රජසිරි විඳිනාහු—

---

* රජාඥා—ඈ. නම්.

"සොත්ථිපසත්ථජනතා ජනතාභිභූත
භූපා සලිල රමණී රමණීයරූපා
ජිතා පුලත්ථිනගරී නගරීති තුඞ්ග
ගෙහා මහාධිපවරා* පවරා පුරානං"

යනාදීන් වර්ණනීයවූ පොළොන්නරුනුවර සිසාරා පූර්වාරාමය, දක්ෂිණාරාමය, පශ්චිමාරාමය, උත්තරාරාමය, කපිලවස්තුය, ඉසිපතනය, කුසිනාරාරාමය, වෙළුවනාරාමය, ජේතවනාරාමය, ලඞ්කාතිලකය, ත්‍රිවඞ්කය, ඇතුබද්දලෙනය යනාදිවූ විසිතුරු විහාර කරවා එහි නොයෙක් දහස්ගණන් මහාසඞ්ඝයා වස්වා ශත්‍රුරාජචොළකුලාන්තක, උද්ධතරාජනිර්මූල, දුළීලබ්ධිමථන, දුර්නීතිවාරණ, ප්‍රකෘතභද්‍ර, සකල දිග්විජය, අනන්තශ්වරශත්‍රුවිජය, ශරණාගතවජ්‍රපඤ්ජර, පරමන්ත්‍රභෙදවික්‍රමප්‍රතාප, අකලඞ්ක, සර්වශත්‍රුශිරොමණි, ප්‍රකෘත්‍යනුකෘත්‍යනිශ්චය, පරරාජගොධූජිජ්ජටි, නෘහරිකෙරවරාජහංස, පරනාරීසහොදර, අරිරාජවෙශ්‍යාභුජඞ්ග යනාදිවූ තමන්ගේ අභිනවවීරවිරුදු නාමයෙන් තුන්සිය සැටක් පිරිවෙන් කරවා තුන්දහස් සත්සියක් මාලුවරුන්වහන්සේට නිරන්තරව උපස්ථානකෙරෙමින් සුවසථයෙන් වසන්නාහු පූර්වොක්තක්‍රමයෙන් ශාසනය භින්නකරනුසඳහා අන්‍යතීර්ථකයන් විසින් උපදවනලදුව නින්දිතව පැවතඑන වෛතුල්‍යවාදාදිවූ අධර්මය ධර්මයයි පවත්වා ගෙන වසන පාපි මහණුන් නිසා යටකි වළගම්අභාමහරජහු පස ලොස්වන්නෙහි පටන් තමන්ගේ සතරවන්නට එක්වාදහස් දෙසිය සිව්පනස් අවුරුද්දක් මුළුල්ලෙහි භින්නනිකායවූ ශාසනය පිරිහෙන පවත් අසා "සුපරිශුද්ධවූ බුද්ධශාසනයෙහි මෙවැනි කිලුටක් අස අසා මාවැනි ආඥාචක්‍රවර්තීයක්හු උදාසීන වුවහොත් බුද්ධශාසන නස්සි, බොහෝසත්හු අපායභාගී වෙති; පස්වාදහසක් පවත්නා බුද්ධශාසනයට මා වහල් වුව මැනවැ" යි ප්‍රඥාපුරස්සර කරුණාවෙන් සඤ්චොදිත හෘදය ඇතිව "මෙසේ නස්නා ශාසනය කවර කෙනෙකුන්වහන්සේ පිටිවහල්කොටනගෙ නිර්මලව පවත්නා පරිද්දෙන් ශුද්ධ කෙරෙම් දෝහො" යි සිතා එකල්හි ත්‍රිවිධ ශාසනයට ආධාරව සිටි අඛණ්ඩාච්ඡිද්‍රතාදි විවිධගුණගණොපලක්ෂිත ඖදුම්බරගිරි අරණ්‍යවාසි මහාකාශ්‍යප ස්ථවිරප්‍රමුඛ මහාවිහාරවාසි මහාසඞ්ඝයාවහන්සේ කරා එළඹ එපවත් දන්වා, ඉක්බිති නිර්මලවූ සර්වඥශාසනය දුෂ්ප්‍රතිපත්තීන් කෙලසන ධර්මරුචිය සාගලිකය වෛතුල්‍යවාදීය යන නිකායවාසිවූ නොයෙක්

* මහාරිපවරා—පොත්.

සියගණින් දුශ්ශීල පාපි භික්ෂූන් ගෙන්වා ලතාමණ්ඩපයෙක්හි සන්නිහිතකරවා තුන්යම් රාත්‍රියෙහි සිව්පියෙහි සිට ඔවුන් හැම දෙනම ශාසනාපගත කරවා බුද්ධශාසනය ශුද්ධකොට තුන්නිකාය සමඟ කරවා එම කුසලානුභාවයෙන් අවසන්හි සුවාසූදහසක් රන්ගිරිකුළින් විරාජමානවූ හිමාලය වනප්‍රදෙශයෙහි ස්වර්ණ ගිරිශිඛරයෙක කල්පස්ථායිවූ **නරදෙව** නම් දිව්‍යරාජව උපන්හ.

මෙසේ එකල පවත්වනලද ශාසනශුද්ධිය ඒ රජහු ස්වර්ගස්ථවූ සංවත්සරයෙහි පටන් සතිස් අවුරුද්දක් නිර්මලව පැවැත නැවත පෙර පරිද්දෙන්ම පිරිහෙන්ට වන්කල්හි එම මහලු පැරකුම් රජහු පටන් **පණ්ඩිතවිජයබාහුය, කිලිංගොස්දුම්හිඳුය**, **කීර්ත්තිනිශ්ශඞ්කය, වීරබාහුය. වික්‍රමබාහුය, චොඩගඞ්ගය**, **ලීලාවතීය, සාහසමල්ලය**, **කල්‍යාණවතීය. ධර්මාශොකය. ඇණීඞ්ගය, ලීලාවතීය, ලොකෙශ්වරය, ලීලාවතීය, පරාක්‍රමපාණ්ඩ්‍යය,** යන මේ පසළොස් රජුන් ඇවෑමෙන් සිරිලක රජ පැමිණි **මාඝ** නම් ලද පූර්වාභිධාන ඇති **කාලිඞ්ගවිජයබාහු** නම් මහරජහුගේ පූර්වභාගප්‍රවෘත්ත මහවියවුලින් පුලස්තිපුරාදි පුරාතනස්ථානයෙන් ඉගිළ පත්පොත් ආදි පිරිකර තුබූ තුබූ තෙන හැර ශරණනෙවළිව මායාරජයට පැමිණි මහාසඞ්ඝයාට චීවරාදි චතුර්විධප්‍රත්‍යය ප්‍රදානයෙන් උපස්ථානකොට වෙසෙමින් ශාරිපුත්‍ර මහාස්වාමීන්ගේ ශිෂ්‍ය තත්කාලශාසනානුශාසක **සඞ්ඝරක්ෂිත මහාස්වාමීන්** හා දිඹුලාගල වනවාසි **මෙධඞ්කර මහාස්ථවිර** ප්‍රමුඛ මහාසඞ්ඝයාවහන්සේ ජම්බුද්‍රොණී නම් පුරවරාසන්නයෙහි තමන්ගේ නමින් කරවූ විජයසුන්දරාරාම නම් මහාවිහාරයෙහි රැස්කරවා මහාසඞ්ඝයාවහන්සේ කෙරෙහි උපන් නොයෙක් විවාද මහොත්සාහයෙන් සන්හිඳුවා අමුතු කතිකාවතකුදු කරවා බොහෝ ශාසනොපකාර කළ **විජයබාහු වන්හිමි** නම් මහරජාණන්ගේ අතිජාතපුත්‍රවූ ශත්‍රුපඞ්ක විශොෂණ ශරත් මාර්තණ්ඩමණ්ඩලායමානවූ ජම්බුද්‍රොණීපුරනිවාසිවූ කලිකාලසාහිත්‍යසර්වඥ **පණ්ඩිත පරාක්‍රමබාහු** නම් මහරජාණෝ සිරිලක රජ පැමිණ අධිකතර රාජාභිමාන උපදවා පොළොන්නරු, පුලච්චේරි, කොටසර, ගංතලා, කවුඩාපුළු, කුරුඳු* පදිමානා, මතුගොණ, ඩෙබරපටුන්, ඌරාතොට, ගොමුඞු, මීපාතොට, මඬලි, මන්නාරම් ආදිවූ ඒ ඒ ස්ථානයෙහි කඳවුරු බැඳ උන් දෙමළ මළල ජාවකාදිවූ සතුරුවියවුල් සන්හිඳුවා සකල ලඞ්කාතලය හස්තගත කොට රාජ්‍යශ්‍රී විඳිමින් ශ්‍රීවර්ධනපුරාදි නානාස්ථාන

* කවුඩාමූළු කවුකුරුදු—ඇතම.

යෙහි විසිතුරු විහාර කරවා මහාසඞ්ඝයාවහන්සේ එහි වස්වා චීවර පිණ්ඩපාත ශයනාසන ගිලානප්‍රත්‍යය යන සිව්පසඳනයෙන් උපස්ථානකොට වසන්නාහු ඒ ඒ තන්හි ප්‍රමාදවිහාරිව වසන ශාසනාවචරකුලපුත්‍රයන්ගේ ශාසනපරිහාණිකරවූ අනාචාර බහුලත්වය අසා "ශ්‍රද්ධාවත් පූර්වරාජොත්තමයන් විසින් මහොත්සාහයෙන් සෙමෙහිතබාලූ ශාසනය මා දවස මෙලෙස වීම අනුචිත වේදැ" යි සිතා දිඹුලාගල පරම්පරාවෙන් පැවැත එන **බුද්ධවංශ වනරතනාභිධාන** මහා ස්ථවිරපාදයන්ගේ ප්‍රධානශිෂ්‍යවූ **ආරණ්‍යක මේධඞ්කර** මහාස්වාමි ප්‍රමුඛ උභයවාසයෙහි කාරකමහාසඞ්ඝයාවහන්සේ සන්නිහිත කරවා සාදර සිතින් සඟමැදට වැද ශාසනස්වරූප දක්වා භික්ෂුභාවයට අයොග්‍යවූ දුශ්ශීල ශීලවිපන්නයන් පහකරවා ශාසනය ශුද්ධකොට ප්‍රමාදවිහාරීන්ට අවසර නොහරිනලෙස අවවාදනුශාසනකොට ග්‍රන්ථධුර විදර්ශනාධුර යෙදී වසනසේ විනයානුකූලව පැවැත එන ශාසන සිරිත පස්වා දහසක් පවත්නා පරිද්දෙන් කතිකා කරවා උභයවාසය අඛණ්ඩව පැවැත්ත මැනවැයි සිතා පුටභත්තසෙලාභිධාන පළාබත්ගල බ්‍රහ්මවිමානොපමවූ ප්‍රාසාදයක් කරවා රූක්ෂප්‍රතිපත්තිපූරණයට ආත්මක්ෂමවූ අල්පෙච්ඡතාදි ගුණොපෙත ප්‍රතිපත්තිසාර වනවාසි භික්ෂූන් එහි වස්වා දහස්ගණන් මහාසඞ්ඝයා උපසම්පන්න කරවා තමන්ගේ සහොදරවූ මල් **භුවනෙකබාහු** නම් ඈපාණන් ලවා බොහෝ මහණගණියාට අසනතැන් කියවා අපමණ ශාසනාභිවෘද්ධි කරවා බුදුසසුන් බැබලවූහ. එකලට අප බුදුන් පිරිනිවි එක්දහස් අටසිය නවඅවුරුද්දෙක් අතික්‍රාන්ත විය.

යටකී මහානාම රජුදවස **බුද්ධඝොෂ** නම් අටුවාචාර්‍ය්‍ය මහාස්ථවිරපාදයන් පටන් මේ අතුරෙහි බුද්ධදත්තය, ධර්‍ම්මපාලය, ජොතිපාලය, ක්ෂෙමය, ධර්‍ම්මශ්‍රීය, නන්දය, ආනන්දය, අනුරුද්ධය, උපතිෂ්‍යය, බුද්ධරක්ෂිතය, මෞද්ගල්‍යායනය, යනාදිවූ ආචාර්‍ය්‍ය මහාස්ථවිරයන් හා එසේම එකශ්‍රැතින් නෛක සහස්‍ර ග්‍රන්ථධාරණයට සමර්ථවූ වජ්‍රඥාන ඇති ශාරිපුත්‍ර මහාස්වාමිපාදයන් පටන් සඞ්ඝරක්ෂිතය, සුමඞ්ගලය, වාගීශ්වරය, ධර්‍ම්මකීර්ත්තිය, නාගසෙනය, ආනන්දය, වෛදෙහය, බුද්ධප්‍රියය, අනවමදර්ශිය යනාදි මහාස්ථවිරවරයෝ නොයෙක් ටීකාටීකථා හා තත්ප්‍රවෙශොපායවූ අනෙකප්‍රකාර ධර්‍ම්මප්‍රබන්ධ හා සන්න ගැටපද පිටපත් ආදිය උපදවා බුදුන්ගේ පර්‍ය්‍යාප්තිශාසනය බැබලවූහ.

එසේම ශෛලාකසිද්ධාපීය, සාහිත්‍යවිල්ගම්මූලය, අනුරුද්ධය, දීපඞ්කරය, මයූරපාදය, ධර්‍ම්මසෙනය යනාදි ස්ථවිරවරයන් හා

ශූරපාදය, ධර්මකීර්ත්තිපාදය, ධීරනාගපාලය, රාජමුරාරිය, කවිරාජ ශෙඛරය, ගුරුළුගෝමිය, ආගමචක්‍රවර්ත්තිය, පරාක්‍රමපණ්ඩිතය, අග්‍ර පණ්ඩිතය, යනාදිවූ ගෘහස්ථපණ්ඩිතජනයෝ ධර්මානුගත ශ්ලොක ප්‍රබන්ධ හා විචිත්‍රාර්ථප්‍රකාශවූ සන්න ගැටපද හා නොයෙක් ධර්ම ව්‍යාඛ්‍යාන ඉපදවූහ. එම ව්‍යාඛ්‍යානමුඛ ගෙන මෙකල් දක්වා කාලානුරූප ධර්මව්‍යාඛ්‍යාන උපදවමින් ප්‍රාඥවරයෝ බුදුන්ගේ පර්‍ය්‍යාප්තිශාසනය බබුළුවමින් සිටියාහුමය.

ඉක්බිති ඒ පණ්ඩිතපරාක්‍රමබාහු මහරජාණන්කෙරෙහි පටන් **බෝසත් විජයබාහුය,** යාපව්පුර නිවාසි **මහාභුවනෛකබාහුය, පරාක්‍රමබාහුය, වන්නිම් භුවනෛකබාහුය,** හසති ශෛලපුර නිවාසි **පණ්ඩිත පරාක්‍රමබාහුය, වන්නි භුවනෛකබාහුය, විජයබාහුය*** යන මේ සත්රජුන් අවෑමෙහි මහවැලිගං අස **ගඞ්ගාශ්‍රීපුර** නම් රාජධානියෙහි රජ පැමිණි සතරවැනි **භුවනෛකබාහු** මහරජාණන් සතරවන්නට අප බුදුන් පිරිනිවී එක්වාදහස් අටසිය සුවානූ අවුරුද්දෙක් අතික්‍රාන්ත විය. එකල මේඝවරවංශාභිජාත **සේනාලංකාධිකාර සෙනෙවිරත්** නම් මන්ත්‍රීශ්වරයාණ කෙනෙක් මුතුමැණික් ආදි බොහෝ වස්තු යවා කාඤ්චිපුරයෙහි සලපිළිමගෙයක් කරවා දෙව්නුවර තුන් මහල් සිටිපිළිමගෙයක් කරවා අක්බෝවෙහෙර අටලොස්රියන් මහපිළිමගෙයක් කරවා තවද තමන්ගේ ජනමප්‍රවේණී සිඳුරුවාණ නුවර පර්ණශෛල නම් පර්වතය මුදුනෙහි කෛලාසපර්වතය සේ ශොභාමත්වූ අභිනව ලඞ්කාතිලක නම් රජමහාවිහාරයක් කරවා තෙසුත් බොහෝ කුශලරාශි වර්ධනය කෙරෙමින් ශ්‍රද්ධාවත්ව වසන්නාහු ශාසනාවචර කුලපුත්‍රයන්ගේ ශාසන පරිහාණිකරවූ අනාචාරබහුලත්වය අසා අමරගිරිවාසවාසි **වනරතන මහාස්වාමි** ප්‍රමුඛ උභයවාසයෙහි කාරක මහාසඞ්ඝයාවහන්සේට එපවත් දන්වා රාජබලය පෙරදැරිකරවාගෙන ශාසනය විචාරා ශුද්ධ කොට කලක් බුදුසසුන් පැවැත්වූහ. ඉක්බිති ඒ භුවනෛකබාහු මහරජාණන්ගේ ඇවෑමෙහි රජයලත් **පැරකුම්රජහු** අවසන එම පුරයෙහි රජ පැමිණි **වික්‍රමබාහු** මහරජාණන් දවස ගිරිවංශාභිජාත **අලගක්කෝනාර** නම් මන්ත්‍රීශ්වරයාණ කෙනෙක් මහත්වූ තෙජෝ බල වික්‍රමයෙන් ලොකපූජිතවැ වසන්නාහු :—

* ජයබාහු-යනු මහාවංශයි.

"පාසාද බොධි වරචඞ්කම මණ්ඩපෙහි
පාකාර සාල පටිමාලය චෙතියෙහි
කල්‍යාණිනාම නගරී රුචිරාපණෙහි
රාජෙති චාරුතර ගොපුර තොරණෙහි"

යනාදින් වර්ණනාකරනලද චක්‍රවාලපර්වතොපම මහාප්‍රාකාර පඞ්ක්තීන් පරික්ෂිප්තවූ එකභූමික ද්විභූමික ත්‍රිභූමික පඤ්චභූමිකාදි ප්‍රභෙද ඇති නානාප්‍රකාර විචිත්‍ර චිත්‍රකර්මාන්ත විශෙෂයෙන් යුක්තවූ භිත්තිස්තම්භ සොපානමාලාවෙන් සමලඞ්කෘතවූ සුධා ධවල කෛලාසකූටප්‍රතිභාග ප්‍රාසාදපඞ්ක්තීන් හා එසේම නානා ප්‍රකාර චෛත්‍යාඞ්ගණ බොධ්‍යඞ්ගණ ප්‍රතිමාගෘහ චඞ්ක්‍රමණ විශාලශාලා ගොපුරශ්‍රෙණීන් විරාජමානවූ විහාරොපශොභිතවූ විශාල වීථිවින්‍යාසයෙන් සම්පන්න උභයවීථිගත නානාදෙශවාසි ජනසමූහසඞ්කීර්ණ සර්වසම්පත්තිසමෘද්ධිසම්පන්න කල්‍යාණීපුරප්‍රවරාදි සිද්ධස්ථාන පිහිටි ශ්‍රීලඞ්කාද්වීපයෙහි ලොකශාසනවිලොපකාරිවූ පරශත්‍රු ප්‍රතිබාහනය පිණිස ස්වාර්ථපරාර්ථප්‍රතිබද්ධ චිත්තප්‍රවෘත්ති ඇති ශ්‍රද්ධා භක්ති* පුරස්සර සකලාභිමතාර්ථ සාධා දිමෙහි සමර්ථවූ ස්ථානොචිත කාර්යාකාර්ය විජානනයෙහි දක්ෂ විචක්ෂණ ගුණී සුවච කීකරු සෙවක මණ්ඩලිකයන් ලවා විධානකරවා කොළම්බාභිධාන ද්‍රොණිමුඛාසන්නයෙහි නිරන්තරව දියපිරී සුරක්ෂිතව වටා සිටි තඩාග මධ්‍යයෙහි දුරුග්‍රාමය සිසාරා ගම්භීර තර පර්වත ප්‍රාන්තයක්මෙන් අති භයානකවූ ගැඹුර හා පුළුල ඇති මහඅගල බිඳුවා ස්ථිරත්වය පිණිස අගල පටන් මුදුනෙහි බඳනා ලද සර්වශෛලමය මහාප්‍රාකාරමස්තකයෙහි අතුරතුර විශ්වකර්ම නිර්මාණයක් මෙන් විචිත්‍රකොට සරහා ඒ ඒ තන්හි කරනලද ඉඞ්ගණී පුලිමුගම් භූමියංතට්වූ අට්ටාල වට්ටවෙට්ටමින් සුරක්ෂිත කොට "අභිනව ජයවර්ධන" යයි යන නමින් ප්‍රසිද්ධ කෝට්ටයක් ලවා එම නුවර මහපවුර මුදුනෙහි සතරදිග ආරක්ෂා පිණිස සිරි ලක අරක්ගත් කිහිරැලිඋපුල්වන්, සමන්බොක්සැල්, විභීෂණ, ස්කන්දකුමාරය යන සතර වරම් මහරජුන්ට වෙන වෙන දෙවස්ථාන කරවා අනෙකප්‍රකාර භෙරිතූර්‍ය්‍යනෘත්‍යගීතවාද්‍යාදියෙන් නිරන්තර පූජොත්සව පවත්වනසේ ව්‍යවස්ථා කරවා සකලසම්පත්තීන් සමෘද්ධ කරවා මහත් ජනගහණ කරවා උමංදූවෙහි ඒසියයක් රජුන් හා අටළොස් අක්ෂෞහිණියක් පමණ මහබලසෙනඟ ගෙන චූලනී බ්‍රහ්මදත්තරජහු අවුත් මියුළුනුවර වටකළ දවස් ජනහිතනිරතවූ

* ශක්ති-ඇදහම.

මහෞෂධාභිධාන ශ්‍රීමහා බෝධිසත්ත්වයන්වහන්සේ භයචකිත රහිතව හිඳ සතුරු මහසෙනඟ ලුහුබඳවා ජයගත්බවට දෘෂ්ටාන්ත දක්වන්නාසේ සිංහසමාන වික්‍රම ඇති සිංහල දෙමළ මහ සෙනඟ පිරිවරා ඇතුළු නුවර උන්තැනම හිඳ එකල චන්ද්‍රචක්‍රාදී විවිධායුධ ගෙන අහස් පොළෝ දෙක දෑදුරුකරු පුරා බෝමැඩට දිව අවුත්වන් නානාප්‍රකාර විරූපවෙශධාරී මාරසේනාව පරිද්දෙන් නානාවර්ණ සන්නාහ බහා ආයුධසන්නද්ධව විසපැලලි නඩ සාල මාරාසි ඉදිකොට යුද්ධසජ්ජිතව දීයෙන් ගොඩින් එකවිට අවුත් වන් ආර්‍ය්‍යචක්‍රවර්තීන්හා දෙමළ මහසෙනඟ ලුහුබඳවා නැවත ශ්‍රීලඞ්කාධිපතිවූ දුෂ්ටග්‍රාමණීප්‍රමුඛ පූර්වනරවීරයන් විසින් අඹතොට, මියුගුණ, දෙණිගමු, අතුරඹ, පොල්වත්ත, බාණු, තඹුන්න, කසාතොට, සත්බැකෝට්ටය, ගාමණීගම, වසිළිගම, හාලකොළපුර, දීඝාභය, මාගල්ල, කුමහබාණ, කඳමුන්න, විජිතපුර, ගිරිනිල්නුවර, මහේල, අනුරාධපුරාදිවූ නානාස්ථානගත දෙමළකඳවුරු පැහැර කළ වික්‍රම මෙලෙසයයි දියුණුකර දක්වන්නක්හු මෙන්, කොළඹ, වත්හල, මීගමුව, සලාවත ආදිවූ ඒ ඒ ස්ථානයෙහි තානායම් අල්වා අකුරු නොහැර උන් සතුරු මහ සෙනඟ සාධා දශදිගන්තයෙහි යශස්තේජස් පතුරුවා—

"තතානනත කනතබබ සුධාර භූතො
රූ ලඞ්කාර ලඞ්කා සුවණ්ණණ්ණද්දි වාසො,
සපත්තාහ කුමහ බබිහෙදෙ පවීණො
විරාජෙති වීරාලඞ්කාධීස සීහො"

යනාදීන් නෛක කවිවරයන් විසින් වර්ණනීයව චීපාධිරාජය, මණ්ඩලිකරාජය, ප්‍රදෙශරාජය, අනන්තරභොගිකරාජය, අනුශාසක රාජය යන පඤ්චප්‍රකාර රජදරුවන් කෙරෙහි ඇතුළත්ව දානප්‍රියවචන අර්ථචර්‍ය්‍යාසමානාත්මතා සඞ්ඛ්‍යාත චතුස්සඞ්ග්‍රහවස්තුවෙන් ජනරඤ්ජනය කෙරෙමින් පරලොකප්‍රතිෂ්ඨාව පිණිස මළුකම්කරවා නෛක සහස්‍රවස්තුපරිත්‍යාග පූර්වඞ්ගමව සිඳුරුගිරිවිහාරාදී ආරාමවින්‍යාසයෙන් රජමහවිහාර කරවා වඤ්ජිපුරපුරඤ්ජර,* ගිරිවංශශෙඛර, නිශ්ශඞ්කඅලකෙශ්වරාදී, වංශානුගත ගොත්‍රවිදුරුනාමයෙන් පිරිවෙන් ව්‍යවස්ථා කරවා, තවද නානාදෙශවාසි නිඛිලජනප්‍රාර්ථනීයවූ සකල නගරාඞ්ගසම්පත්තීන් යුක්ත ජනමප්‍රවෙණිවූ රාජග්‍රාමපුර ප්‍රවරාසන්නයෙහි ග්‍රාමාරණ්‍යවාසී මහාසංඝයාවහන්සේට වෙන

* කාඤ්චීපුරපුරඤ්ජර-ඇතම.

වෙන විහාර කරවා සිව්පසදනයෙන් උපස්ථානකෙරෙමින් කුශල රාශි වර්ධනය කෙරෙති. මෙසේ ශ්‍රද්ධාවත්ව වසන ඒ අමරගිරිවස නිස්සඞ්ක අලගක්කෝනාර නම් මන්ත්‍රීස්වරයාණෝ ඒ ඒ ස්ථානවල ස්වච්ඡන්දිකව වසන ශාසනාවචරයන්ගේ අනාචාරස්වරූප අසා තදුපාය සොයන්නාහු සස්‍යජාතාන්තරයෙහි නැගි තණ්ලවන් නෙලා හැර සස්‍යජාතයන් රක්නා ඇල්ගොවියන්සේ පූර්වකාලයෙහි ශ්‍රද්ධාවත් රාජරාජ මහාමාත්‍යාදීන් විසින් ආඥාචක්‍රය මුල්ව මහොත්සාහයෙන් බුදුසසුන් පවත්වා කළ කී නොයෙක් ශාසනොපකාරයෙහි ආද්‍යන්ත ප්‍රවෘත්ති අසා පලාබත්ගල වනවාසි පරම්පරාවෙන් අසම්භින්නව පැවත ආවාවූ රක්ෂිත පොෂිත ශීලස්කන්ධාදි අනෙකගුණගණානුභාවොත්පන්න දසදික්හි පතළ තෙජස්කීර්තිශ්‍රී ඇති ශ්‍රී ධර්මකීර්ති නම්වූ අප මහාස්වාමිපාදයන්ට එපවත් දන්වා බුදුන් පිරිනිවී එක්වාදහස් නවසිය දෙලොස්වන අවුරුදු උභයවාසයෙහි කාරක මහාසඞ්ඝයා රැස්කරවා සඞ්ඝමධ්‍යගතව කල්‍යාණාධ්‍යාශයෙන් යෙදී රජබලය පෙරදැරිකරවාගෙන ලජ්ජීන් වහන්සේට බලය ලා දී ශාසනය විචාරාප්‍රසිද්ධව වසන දුශ්ශීල ගණනක්දෙනා සිවුරු හරවා කලක් බුදුසසුන් පවත්නාසේ සොමෙහි තුබූහ.

එකල්හි කරවූ සඞ්ඝසාමග්‍ර්‍යය පස්වැනි භුවනෛකබාහු පසලොස්වනු පෙරවා කාලානුරූපව පවත්වමින් සිටියේය. මෙම පසලොස්වන්නට අප බුදුන් පිරිනිවී එක්වාදහස් නවසිය එකුන්තිස් අවුරුද්දෙක් අතික්‍රාන්ත විය. පසුව එම භුවනෛකබාහු විසිවන්නෙහි එම රජුන් සුහුරුබඩු මෙහෙණ්වර වීරබාහු නම් ඈපාණෝ රජතන් පත්ව තමන්ගේ නාමයට සුදුසුවූ ගුණානුවර්ණ යසස් තෙජඃප්‍රතාපරූපෛශ්වර්‍ය්‍යාදිවූ සාතිශය විශෙෂානුගත මහත්වූ ශෞර්‍ය්‍යවීර්‍ය්‍යපුරුෂබලපරාක්‍රමයෙන් හා අනෙකොපායශක්තීන් යුක්තව දෙමළමලලයොනකාදි සතුරු සොර සියලු වියවුල් සන්සිඳුවා සකලලඞ්කාතලය එකාතපත්‍රකොට රාජ්‍යශ්‍රී විඳිමින් 'පූර්වොපචිත කුසලබලයෙන් ලද්දාවූ සම්පත්තිවිශෙෂය අපවත් නොකළ මැනවැ' යි යන අදහසින් බුදුන් උදෙසා බත් මල් පහන් පූජා කරවමින් ධර්මකථිකයන්ට සත්කාරකොට සාදරව බණ අසමින් සඞ්ඝයාවහන්සේට දරුගම් වටනා පස සලස්වා සිව්පස දානයෙන් උපස්ථාන කෙරෙමින් සමහර බ්‍රාහ්මණයන්ට ගම් බිම් ක්ෂෙත්‍ර වස්තු දන්දෙමින් සමහරුන්ට වස්ත්‍රාභරණ ධනධාන්‍ය දන්දෙමින් සමහර බ්‍රාහ්මණයන්ට හා වන්දිභට්ටයන්ට දාසි දස් ගව මහිෂාදීන් හා අශ්වදාන ගජදාන ගොදාන රථදාන කන්‍යාදානාදීන් සඞ්ග්‍රහ

කෙරෙමින් අවශෙෂ යාචකයන් අන්නපාන වස්ත්‍රදානාදීන් සන්තොෂකරවා මෙසේ තමන්ගේ බාහුබලවික්‍රමයෙන් උභය ලොකාර්‍ථසංසිද්ධියට එකාන්ත කාරණවූ දානධර්‍ම රක්‍ෂාකිරීමෙන් ස්වදෙශ දෙශාන්තර දෙක්හි එකපැහැර කීර්ත්ති පතුරුවා—

"රුචිරගුණමණීනං ආකරො මෙරුසාරො
රිජනමදගජානං දප්පිතො කෙසරින්දො
කවිජනකමලානං භානුභූතොරුතෙජො
ජයති සකලලඞ්කං වීරබාහාදිපාදෙ.

විමලවිපුලසද්ධො සාරදානාභිරතො
විදිතසමයතන්තො සො දයොදාරචිත්තො
ජිනතනුජදිජානං වන්දිනං සෙසකානං
අදදි පවරගාමෙ ගොගජස්සිත්ථිදාසෙ"—

යනාදීන් තමන් මෙසේ ස්වභාවයෙන්ම වර්ණණීය විශෙෂ ගුණ ඇතොතිනුත්—

"අනඤ්ඤරාජඤ්ඤසමානමානො
මහත්ථදානෙ ධනදොපමානො
රාජා පජාරඤ්ජනලද්ධවණ්ණො
තිසීහලං සාසති ධූතවෙරිං.

නිරන්තරං මත්තමතඞ්ගජෙව
සමාගතා යාචකභිඞ්ගමාලා
පීනෙති සො දානරසෙන සම්මා
සයම්ව තෙසං ථුතිගීතිකාහි"—

යනාදීන් දක්වනලද පූර්‍වරාජයන්ගේ සාතිශය විශෙෂ ශ්‍රවණයෙන් සඤ්ජාතවූ සාභිමානචිත්තොත්සාහ ඇතිව ලඞ්කාධිපතිවූ ශ්‍රද්ධාවත් මහ රජුන් දවස පැවති ධර්‍මානුගත රජසිරිත් හැම කාලානුරූපව පවත්වම්යි යන උදාරාධ්‍යාශයෙන් ලොකශාසනොපකාරයෙහි නිරතුරෙන් තත්පරව ත්‍රිරත්නානුගත චිත්තප්‍රසාදයෙන්ම නවරත්නයෙන් හා ත්‍රිරත්නශොභාවෙන් ශ්‍රීමත්වූ ශ්‍රීලඞ්කාද්වීපයට ආරක්‍ෂා පිණිස ශෞර්‍යවීර්‍යාන්විත සෙවකජනයන්ට තරම් පඩි සලස්වා ඔවුන් හැම ඛඩ්ග කුන්ත ධනුශ්ශිල්පාදියෙහි දක්‍ෂ කරවා සෙනා වාහන සන්නද්ධකරවීමෙන්ම රෞද්‍රවූ විරුද්ධ ජනයන් භය ගන්වා පර සතුරන් දුරුකොට රජය සෙමෙහි තබා දවසින් දවස පින පිනා කුසල් සිත වඩවමින් දන්හල් කරවා නානාසමයවාසිවූ පණ්ඩරඞ්ගාදී පාෂාණ්ඩයන් හා අවශෙෂ යාචකයන්ට දන්දෙමින්

බ්‍රාහ්මණයන්ට හා වන්දිභට්ටයන්ට වඩවඩා ධනධාන්‍ය වස්ත්‍රාභරණ යාන වාහනාදිය දන්දෙමින් සන්තුෂ්ටකරවා ඔවුන් කරන ස්තුති ඝොෂයෙන් පිනපිනා—

තවද තමන් ස්වභාවයෙන්ම ශාසනභක්ති ඇතිහෙයින් උභය වාසයෙහි මහාසංඝයාවහන්සේට නිරන්තරයෙන් මහදන් පවත්වා භාණ්ඩාගාරයෙන්ම සිවුරු දී කුලපුත්‍රයන් මහණ මහලුපැවිදි කරවා මතු ශාසනරක්ෂාවට යොග්‍යතැන් බලා පරීක්ෂාකොට අගතැන් මහපදවි ආදිවූ ස්ථානාන්තර පමුණුවා යුක්තප්‍රාප්ත කාලයෙහි සඞ්ඝදර්ශන ප්‍රභවප්‍රීතිප්‍රාමොද්‍යරසාස්වාද කෙරෙමින් සඤ්ජාතවූ ශාසනාභිලාෂ ඇතිව තමන්ගේ ප්‍රධාන පුත්‍රයාණන් ශාසනස්ථ කරවා වඩ වඩා මෙසේ ශ්‍රද්ධාවත්ව වසන්නාහු පිරිසර වැසි සමහර ශාසනාවචරයන්ගේ අනාචාර බහුලත්වය අසා යට කියනලද රක්ෂිත ගොපිත ශීලස්කන්ධාදි ලෞකික ගුණගණානුභාවොත්පන්නව දසදික් පතළ තෙජස්කීර්තිශ්‍රී ඇති **ශ්‍රීධර්මකීර්ති මහාස්වාමි** පාදයන්වහන්සේගේ අනුජාත ශිෂ්‍ය පුත්‍රවූ තත්කාල ශාසනානුශාසක **විතීය ධර්මකීර්ති මහාස්වාමි** පාදයන් ප්‍රධාන කොට ශාසනොපස්තම්භකාරිවූ ගලතුරුමුල **මෛත්‍රෙය මහාස්ථවිරපාදයන්** ඇතුළුව උභයවාසයෙහි මහාසංඝයා රැස්කරවා පෙර පැවති චාරිත්‍රලෙස ලජ්ජීන්වහන්සේට බලය ලා ශාසනය විචාරා දුශ්ශීලමල පහකොට නිර්මල කිරීමෙන් බුදුසසුන් බැබළවූහ. එකලට බුද්ධ වර්ෂයෙන් එක්වාදහස් නවසිය එකුන්සාලිස් අවුරුද් දෙක් අතික්‍රාන්ත විය.

එසේහෙයින් සාසන පක්ෂපාත මධ්‍යස්ථ ශ්‍රද්ධාවත් ධර්මාශොකාදිවූ මෙකී පූර්වනරවීරයන් විසින් කරනලද ශාසන පවිත්‍ර චාරිත්‍රය හා තවද—

" යොදූරචාරුමතිමා ජිනසාසනම්හි
සඤ්ජාත සාසනමලං යදි සොධයෙය්‍ය,
පුඤ්ඤෙන තෙන තිදිවෙසු චිරං චරිත්වා
තෙනෙව යාති වරසන්තිපුරං සුරම්මං "—

යනාදීන් " යම්කිසි ශ්‍රද්ධාවත් නුවණැති මහොත්තමයෙක් ස්වාර්ථ පරාර්ථභඤ්ජකවූ දුර්ජන දුශ්ශීලමහණුන් නිසා සර්වඥශාසනයෙහි උපන් යම් කිසි කිළුටක් අසා දැන ලා හෙළා නිඳා නොබැණ ධර්මාන්විතව විචාරා වස්තුලෙස පිළිපැද ශාසනය ශුද්ධකොට ආත්මාර්ථ පරාර්ථසාධකවූ සාධුසම්මත ලජ්ජිබලය පවත්වා සර්වඥශාසනයට පිටුවහල්වූයේ වීනම් එතෙම එම කුසලානුභාවයෙන් බොහෝ කාල

යක් මුළුල්ලෙහි ච්‍යුතිප්‍රතිසන්ධිවශයෙන් සදෙව්ලොව සැරිසරා සැප විඳ අතිප්‍රවරවූ නිවන්පුර පැමිණෙන්නේය" යි දක්වනලද මේ පාලිවචනය සිත තබා තත්කාලොචිත ආඥාපුරස්සර පුරුෂොත්තමයන් විසින් තමතමා අවධියට සර්වඥශාසනයෙහි පැමිණි දුස්සීලමල පහකිරීමෙන් පස්වාදහසක් පවත්නාලෙස බුදුසසුන් බබුළුවා එයින් ජනිතවූ ඉෂ්ටවිපාකයෙන් මතු ස්වර්ගමොක්ෂසම්පත්ති සාධනය සකලාභිමතාර්ථසිද්ධියට උත්සාහ සිතුව යහපති.

අම්හෙහි කිං අසුතමත්ථි ඉතො අඤ්ඤතං
ඤාතාම සබ්බමිති චෙත්ථ න චින්තනීයං
දීපම්හි ජොතිසහිතෙ පුන තෙලසෙක
සාදිස්සකං මම ඉදං වචනං හි තස්මා.

නිච්චං නෙකදිගන්තපත්ථටමහාතෙජොසහස්සංසුනා
හෙත්වා දුජ්ජනසබ්බඝොරතිමිරං නිස්සෙසතො සන්තතං
තොසෙත්වා සජ්ජනාලිහංසසහිතං සඞ්ඝාරවින්දාකරං
ලඞ්කායෙ සුචිරං රමන්තු පවරා රාජාදිරංසිස්සරා.

ධම්මො පවත්තතු චිරාය මුනිස්සරස්ස
ධම්මෙ ඨිතා වසුමතීපතයො භවන්තු
කාලෙ පවස්සතු ඝනො නිඛිලා පජාපි
අඤ්ඤඤ්ඤඤ්ඤමෙත්තිපටිලාභසුඛං ලභන්තු.

ශ්‍රද්ධාබුද්ධි සම්පන්න විචාරක්ෂම මධ්‍යස්ථ රාජරාජ මහාමාත්‍යාදීන් නිසා ශාසනය පවත්නා බව හඟවනු පිණිස දෙවරක්ෂිතාභිධාන ජයබාහු මහාස්ථවිරයන් විසින් උපදවනලද මේ **නිකායසඞ්ග්‍රහ** නම්වූ ශාසනාවතාරචරිතය ශාසනොපකාර කෙරෙමින් ශාසනාන්තය දක්වා පවතීවා.

ගඞ්ගාසිරිපුරෙ රම්මෙ භුවනෙකභුජෙ පුරා
රජ්ජං කාරයමානෙ යො ධම්මකිත්තියතිස්සරො
ගඩලාදෙණිගාමම්හි සද්ධම්මතිලකව්හයං
විහාරං කාරයිත්වාන වාසයී සුචිරං තහිං

තස්ස සිස්සසුතො ධීරො දෙවරක්ඛිතනාමකො
ජයබාහූති නාමෙන විස්සුතො ලොකපූජිතො
ධම්මකිත්තිමහාථෙරො ඉති තන්නාමභූසිතො*
පත්වා යො සඞ්ඝරාජත්තං සොභෙති ජිනසාසනං

* ඉති තෙනෙව භූසිතො—ඇතම්.

නිකායසඞ්ගහං එතං සභාසාය සමාසතො
අකාසි සො සදා සත්‍ථු සාසනස්සාභිවුඩ්ඪියා.

---

ඉදං චක්ඛුභූතං හිතං ගන්ධජාතං
කරොන්තෙන පත්තං මයා යන්තු පුඤ්ඤං
ඉමෙ තෙන සත්තා මුනින්දෙන යාතං
සිවං වීතසොකාපදං පාපුණන්තු.


සුරා අච්ඡරානං ගණාදීහි සද්ධිං
චිරං දෙවලොකෙ සුඛං චානුභොන්තු
චිරං ඨාතු ධම්මො ජිනින්දස්ස ලොකෙ
සුඛං ලොකපාලා මහිං පාලයන්තු.

**නිකාය සඞ්ග්‍රහය නිමි.**

---

H. R. COTTLE, GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු